# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 01යි. මුළු ලකුණු 40කි.**

- ★ වරණ හතරක් සහිත බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4) වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තේරීම අපේක්ෂා කෙරේ.
- ★ සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය වන පරිදි ප්‍රශ්න සකස් කර ඇත.
- ★ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

PAST PAPERS WIKI

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. විවිධ බාහිර බලපෑම්වලට ලක්වුව ද, ශ්‍රී ලංකාවට ආවේණික වූ සමාජ සංස්කෘතික රටාවක් බිහිවීම කෙරෙහි බල පෑ සාධකය වන්නේ
   (1) දූපතක් ලෙස පිහිටීම ය. (2) ඉන්දියාවට ආසන්නව පිහිටීම ය.
   (3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම ය. (4) පෙර-අපර දෙදිග නාවුක මාර්ගයේ පිහිටීම ය.

2. කුරුවිට බටදොඹලෙන, බුලත්සිංහල පාහියන්ගල ලෙන, කිතුල්ගල බෙලිලෙන යන ස්ථාන ලංකා ඉතිහාසය ගොඩ නැංවීමේ දී වැදගත් වනුයේ, ඒවා
   (1) අනුරාධපුර යුගයේ ආරක්ෂිත ස්ථාන ලෙස භාවිත වීම නිසා ය.
   (2) බ්‍රාහ්මී අක්ෂර සහිත සෙල්ලිපි හමු වූ ස්ථාන නිසා ය.
   (3) ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ තොරතුරු ලැබෙන නිසා ය.
   (4) පැරණි සංඝාවාස පිළිබඳ තොරතුරු ලැබෙන නිසා ය.

3. ශ්‍රී ලංකාවට පැමිණි ආර්යයන් ජනාවාසකරණය සඳහා යොද ගත් කප්පකන්දර නදී, ගාල්හ නදී, ගෝණ නදී යන ගංගාවල නූතන නම් පිළිවෙළින් දක්වෙනුයේ කවර පිළිතුරෙහි ද?
   (1) කලා ඔය, ගල් ඔය, යාන් ඔය (2) මී ඔය, දැදුරු ඔය, කලා ඔය
   (3) කලා ඔය, ගල් ඔය, මැණික් ගඟ (4) මැණික් ගඟ, ගල් ඔය, කලා ඔය

4. ශ්‍රී ලංකාවේ ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ ජනාවාසවල ව්‍යාප්තිය පිළිබඳව දැන ගැනීමට ඇති හොඳම සාක්ෂිය ලෙස දක්විය හැක්කේ
   (1) පැරණි රාජධානිවල අගනුවරවල පිහිටීමයි. (2) වැව් හා ඇළ මාර්ගවල ව්‍යාප්තියයි.
   (3) මහාවංශයෙහි සඳහන් ඓතිහාසික තොරතුරුයි. (4) ශ්‍රී ලංකාවේ පැරණි මාර්ගවල විහිදීමයි.

5. A - අනුරාධපුරයෙහි ජය ශ්‍රී මහා බෝධි රෝපණය
   B - කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙනයාමට ජය ගඟ තැනවීම
   C - දන්ත හේමමාලා යුවල දන්තධාතූන් වහන්සේ ලංකාවට රැගෙන ඒම
   D - තෝපා වැව, දුම්බුටුලු වැව හා එරමුදු වැව ඒකාබද්ධ කොට විශාල ජලාශයක් කරවීම

   ඉහත ABC හා D වල සඳහන් කාර්යයන් සඳහා මුල් වූ රජවරුන්ගේ නම් අනුපිළිවෙළින් දක්වන්න.
   (1) කිත්සිරිමෙවන්, දේවානම්පියතිස්ස, වසභ, පළමුවන විජයබාහු
   (2) දේවානම්පියතිස්ස, ධාතුසේන, කිත්සිරිමෙවන්, පළමුවන පරාක්‍රමබාහු
   (3) වළගම්බා, දේවානම්පියතිස්ස, ධාතුසේන, පළමුවන පරාක්‍රමබාහු
   (4) දේවානම්පියතිස්ස, වසභ, මහසෙන්, පළමුවන විජයබාහු

6.

| I තීරුව | II තීරුව |
|---|---|
| (i) නාච්චදූව වැව | A - දැදුරු ඔය |
| (ii) මිනිපේ ඇළ | B - මී ඔය |
| (iii) හුරුළු වැව | C - මහවැලි ගඟ |
| (iv) රිදී බැඳි ඇළ | D - මල්වතු ඔය |
| | E - මෝදරගම් ආරු |
| | F - යාන් ඔය |

   ඉහත I තීරුවේ ශ්‍රී ලංකාවේ විශිෂ්ට වාරි නිර්මාණ කිහිපයක් ද, II තීරුවේ ඒවා හා සම්බන්ධ ගංගා කිහිපයක් ද දක්වා ඇත. I තීරුව අනුව II තීරුව සැකසූ විට ගැළපෙන පිළිතුර තෝරන්න.
   (1) DCFA (2) ECFA (3) ACDF (4) DBCA

7 A - අභයගිරි විහාරය ඉදිකිරීම
   B - නිශ්ශංක අලගක්කෝනාර විසින් කෝට්ටේ බලකොටුවක් ගොඩ නැගීම
   C - පළමුවන රාජේන්ද්‍ර චෝල රජු ලංකාව ආක්‍රමණය කිරීම
   D - ගල් පොත ශිලා ලේඛනය පිහිටුවීම

   ඉහත දැක්වෙන ඓතිහාසික සිද්ධීන්, ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව සැකසූ විට දක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
   (1) ACDB (2) ABDC (3) CADB (4) ADCB

8. ඇළමාර්ග මගින් දිගු දුරකට ජලය ගෙනයාම සඳහා අතීත මෙන් ම වර්තමාන වාරි තාක්ෂණ ශිල්පීන් ද පාදක කර ගත් ගංගාව වනුයේ
   (1) මැණික් ගඟ ය. (2) ගල්ඔය ය. (3) මහවැලි ගඟ ය. (4) වලවේ ගඟ ය.

PAST PAPERS WIKI

9. යාපනය ප්‍රාදේශීය රාජ්‍යය සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?—
   (1) යාපනය ප්‍රාදේශීය රාජ්‍යයේ අගනුවර නල්ලූර් වූ අතර එහි ප්‍රධාන ආගමික සිද්ධස්ථානයක් පිහිටා ඇත.
   (2) වසභ රජතුමාගේ කාලයේ දී 'ඉසිගිරි' නමැති ඇමතිවරයකු යාපනය පාලනය කළේ ය.
   (3) කන්දරෝඩෙයි හෙවත් කදුරුගොඩ විහාරය අතීතයේ යාපනයේ පිහිටි බෞද්ධ මධ්‍යස්ථානයකි.
   (4) පෘතුගීසීහු මුතු ලබා ගැනීම සඳහා යාපනය අල්ලා ගැනීමට උනන්දුවක් දැක්වූහ.

10. ශ්‍රී ලංකාවේ ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ වෙළෙඳපොළක නීති රීති හා සම්ප්‍රදායයන් ගැන සඳහන් වන්නේ
   (1) බදුලු ටැම් ලිපියේ ය.
   (2) මිහින්තලා පුවරු ලිපියේ ය.
   (3) කළුදිය පොකුණ සෙල් ලිපියේ ය.
   (4) සංඝපාල විහාර සෙල් ලිපියේ ය.

11. පළමුවැනි විජයබාහු රජතුමා ශ්‍රී ලංකාවේ බිහි වූ ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස සැලකිය හැක්කේ
   (1) අභාවයට ගොස් තිබූ ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කොට නඩත්තු කිරීම නිසා ය.
   (2) බලවත් සොළී පාලනයෙන් රජරට ප්‍රදේශය නිදහස් කරගෙන ස්වාධීන රාජ්‍යයක් බිහි කිරීම නිසා ය.
   (3) අසල්වැසි ඉන්දියානු රාජ්‍යය සමග මිත්‍රශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා ය.
   (4) මේ වන විට අක්‍රිය ව තිබූ බොහෝ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම නිසා ය.

12. ගලින් තෙලන ලද සිංහයකු සිංහාසනය ලෙස භාවිත කළ පොළොන්නරු පාලකයා වන්නේ,
   (1) පළමුවන විජයබාහු රජු ය.
   (2) දෙවන ගජබාහු රජු ය.
   (3) පළමුවන පරාක්‍රමබාහු රජු ය.
   (4) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු ය.

13. අපගේ ඉතිහාසය හා බැඳුණු ජාතික උරුමයන් රැක ගැනීම සියල්ලන්ගේ ම අවධානයට යොමු විය යුතු කරුණක් වන්නේ
   (1) ඒවා ශ්‍රී ලාංකික අනන්‍යතාව ප්‍රදර්ශනය කරනු ලබන සාධක වන නිසා ය.
   (2) සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට එවැනි දේ වැදගත් වන නිසා ය.
   (3) අපගේ අනාගත පරපුරට මෙවැනි දෑ දැක බලා ගැනීමට හැකිවන නිසා ය.
   (4) ඒවා රැක ගැනීමෙන් පැරණි රජදරුවන්ගේ කටයුතු පිළිබඳ ව අවබෝධයක් ලබා ගත හැකිවන නිසා ය.

14. පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරෙන් දඹදෙණි රාජ්‍ය සමයේ ලංකාවට පැමිණි ගවේෂකයකුට අසන්නට හෝ දකින්නට **නොලැබෙන** සිදුවීම් මොනවා ද?
   A - ජාතක කථා පොත සිංහලයට පරිවර්තනය කිරීම
   B - පළමුවන පරාක්‍රමබාහු රජු හා දෙවන ගජබාහු රජු අතර ඇති වූ සමගි සම්මුතිය
   C - චීනයේ වෙංහෝ සෙන්පතියා ලංකාව ආක්‍රමණය කිරීම
   D - මහා විහාර සීමාව තුළ ජේතවන විහාරය ඉදිකිරීම
   E - කාලිංග මාඝ ලංකාව ආක්‍රමණය කිරීම
   (1) A හා C (2) A හා B (3) C හා E (4) C හා D

15. ක්‍රි.ව. 1638 හා ක්‍රි.ව. 1766 ගිවිසුම් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) ලාංකික රජකු නොමැතිව ලංකාව තුළ අත්සන් කළ ගිවිසුම් වේ.
   (2) උඩරට රජුන් පෘතුගීසීන් සමග අත්සන් කළ ගිවිසුම් වේ.
   (3) ලන්දේසීන් සමග උඩරට රජවරුන් අත්සන් කළ ගිවිසුම් වේ.
   (4) යුරෝපයේ පැවැති පෘතුගීසි-ලන්දේසි මිත්‍රත්වය තහවුරු කිරීමට අත්සන් කළ ගිවිසුම් වේ.

16.

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| (i) පළමුවන රාජසිංහ රජු | A - මහා අස්ථාන කුමරු |
| (ii) දෙවන රාජසිංහ රජු | B - කන්නසාමි |
| (iii) හයවන බුවනෙකබාහු රජු | C - ටිකිරි කුමරු |
| (iv) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු | D - මුත්තුසාමි |
| | E - සපුමල් කුමරු |
| | F - අම්බුලුගල කුමරු |

විවිධ පාලන යුගවල රාජ්‍යත්වයට පත් වූ රජවරුන් කිහිපදෙනකු ඉහත I තීරුවේ ද, ඔවුන් රාජ්‍යත්වයට පත්වීමට පෙර භාවිත කළ නම් II තීරුවේ ද දැක්වේ. I තීරුව අනුව II තීරුව සැකසූ විට දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
   (1) CAEB (2) ACBF (3) ACED (4) CEAB

17.
   - නායක්කර්වරුන්ට විරුද්ධ උඩරට රදල ප්‍රධානීන්ගේ නායකත්වය දැරීම
   - කන්නසාමි කුමරු උඩරට රාජ්‍යත්වයට පත් කිරීම
   - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බලයෙන් පහ කිරීමට ඉංග්‍රීසීන්ගේ සහාය පැතීම

ඉහත ප්‍රකාශ හා සම්බන්ධ වන උඩරට රදල ප්‍රධානියා කවරෙක් ද?
   (1) පිළිමතලාවේ මහ අදිකාරම්
   (2) කැප්පෙටිපොල දිසාව
   (3) මොල්ලිගොඩ? දුගල්ලේ දිසාව
   (4) ඇහැලේපොල මහ අදිකාරම්

PAST PAPERS WIKI

18. ක්‍රි.ව. 1829 දී කෝල්බෲක්-කැමරන් කොමිසම ලංකාවට එවීමේ අරමුණ වූයේ
   (1) එතු එගාවේ යෙදුණු යුරෝපීය ජාතිකයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා ය.
   (2) මෙරට පාලනය කළ ආණ්ඩුකාරවරුන්ගේ ඉල්ලීම් පිළිබඳ විමසා බැලීමට ය.
   (3) ලංකාවේ පරිපාලන හා ආර්ථික වියදම් ඉහළ යාම පිළිබඳ සොයා බැලීමට ය.
   (4) යටත් විජිතයන්ට ස්ථිර ආණ්ඩුක්‍රමයක් නිර්දේශ කිරීම සඳහා ය.

19. ක්‍රි.ව. 1865 ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය දියුණු කිරීමේ අරමුණින් පිහිටුවන ලද මෝර්ගන් කමිටුවේ යෝජනාවක ප්‍රතිඵලයක් වන්නේ
   (1) නිදහස් අධ්‍යාපන පනත නීතිගත වීමයි.
   (2) අධ්‍යාපන මාධ්‍යය මවු බස ලෙස පිළිගෙන ක්‍රියාත්මක කිරීමයි.
   (3) පාසල් සිසුන් සඳහා දිවා ආහාර ලබා දීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමයි.
   (4) අධ්‍යාපන පරිපාලනය සඳහා ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවක් පිහිටුවීමයි.

20. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ විධායක කටයුතු පැවරුණේ
   (1) බ්‍රිතාන්‍ය මහ රජින වෙනුවෙන් පෙනී සිටි අග්‍රාණ්ඩුකාරවරයාට ය.
   (2) නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ය.
   (3) අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයට ය.
   (4) සෙනෙට් සභාව හෙවත් උත්තර මන්ත්‍රී මණ්ඩලයට ය.

21. ආණ්ඩුකාරයා සතුවූ අසීමිත බලතල අඩුකිරීමේ අරමුණ ඇතිව පළමුවරට ව්‍යවස්ථාදායක හා විධායක මණ්ඩලයන් පිහිටුවන ලද්දේ මින් කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් යටතේ ද?
   (1) කෝල්බෲක්   (2) කෲව්-මැකලම්   (3) ඩොනමෝර්   (4) සෝල්බරි

22. කම්කරුවන්ගේ සේවා තත්ත්වය දියුණු කිරීම හා වැඩි වැටුපක් ලබා ගැනීම සඳහා නාගරික කම්කරුවන් මෙහෙයවමින් ඔවුන්ගේ නායකත්වය දැරූ පුද්ගලයා
   (1) එන්.එම්. පෙරේරා මහතා ය.   (2) ඒ.ඊ. ගුණසිංහ මහතා ය.
   (3) එස්.ඒ. වික්‍රමසිංහ මහතා ය.   (4) නටේසර් අයියර් මහතා ය.

23. ජනතාව සෘජුව ම ව්‍යවස්ථා සම්පාදනයට සහභාගී වන අවස්ථාවක් දක්නට ලැබෙනුයේ
   (1) මහමැතිවරණයකදී ය.   (2) පළාත් සභා මැතිවරණයකදී ය.
   (3) ජනමත විචාරණයකදී ය.   (4) ප්‍රාදේශීය සභා මැතිවරණයකදී ය.

24. ආර්ය කණ්ඩායම් මධ්‍යම ආසියාවේ සිට ඉන්දියාවට සංක්‍රමණය වූ බව ඉතිහාසඥයන්ගේ පොදු පිළිගැනීමයි. මොවුන් ඉන්දියාවට සංක්‍රමණය වීම සඳහා භාවිත කළ දුර්ග මාර්ගය ලෙස සැලකෙන්නේ
   (1) සිම්ලා ය.   (2) ඛයිබර් ය.   (3) බෝලාන් ය.   (4) මක්‍රාන් ය.

25. ඉන්දියාවේ සොළොස් මහ ජනපදවලින් වැඩි කොටසක් ව්‍යාප්ත වී තිබුණේ කවර ගංගා නිම්නයක් ආශ්‍රිතව ද?
   (1) සින්දු ගඟ   (2) නර්මදා ගඟ   (3) ගංගානම් ගඟ   (4) ක්‍රිෂ්ණා-තුංගභද්‍රා ගඟ

26. මෝගල් වාස්තු විද්‍යාවේ හා කලාවේ ශ්‍රේෂ්ඨතම නිර්මාණය ලෙස සැලකිය හැක්කේ
   (1) අග්‍රාහි රතු බලකොටුවයි.   (2) ටජ්මහල් මන්දිරයයි.
   (3) කුතුබ්මිනාර් කුළුණයි.   (4) දිල්ලියේ උල්-ඉස්ලාම් පල්ලියයි.

27. සෑම රාජ්‍ය නිලධාරියකු ම තම තරාතිරම අනුව හමුද නිලධාරියකු බවට පත් කිරීමේ වැඩ පිළිවෙළක් හඳුන්වා දුන් මෝගල් පාලකයා වන්නේ,
   (1) බාබුර් ය.   (2) හුමායුන් ය.   (3) ජහන්ගීර් ය.   (4) මහා අක්බාර් ය.

28. බ්‍රිතාන්‍යයන්ගෙන් ඉන්දියාව නිදහස් කර ගැනීමේදී අවි බලය යෙදිය යුතුය යන අදහස ක්‍රියාත්මක කිරීම සඳහා ජපානයේ ආධාර ලබා ගැනීමට උත්සාහ කළ ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ ප්‍රගතිශීලී පිළෙහි නායකයකු ලෙස සැලකෙන්නේ
   (1) බාල් ගංගාධාර් තිලක් මහතා ය.   (2) සුභාෂ් චන්ද්‍රබෝස් මහතා ය.
   (3) සුරේන්ද්‍රනාත් බැනර්ජි මහතා ය.   (4) ලාලා ලජ්පත් රායි මහතා ය.

29. ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලනය පිටු දැකීම සඳහා මහත්මා ගාන්ධිතුමා ආරම්භ කළ ප්‍රබලතම ක්‍රියාමාර්ගය වූයේ
   (1) සහයෝගිතා වර්ජන ව්‍යාපාරයයි.   (2) 'ඉන්දියාවෙන් ඉවත් වෙනු' ව්‍යාපාරයයි.
   (3) සත්‍යග්‍රහ ව්‍යාපාරයයි.   (4) සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරයයි.

30. A - ඉඩම හා බැඳුණු ආර්ථික රටාව   B - රජු වෙත සියලු බලතල කේන්ද්‍රගත වූ පාලන ක්‍රමය
   C - රජුට ස්ථිර යුද්ධ හමුදාවක් තිබීම   D - බලය විකේන්ද්‍රගතව තිබීම
   E - ප්‍රාදේශීය පාලකයන් සතුව පෞද්ගලික හමුද තිබීම

ඉහත A සිට E දක්වා වූ කරුණු අතුරෙන් ජාතික රාජ්‍යයක ලක්ෂණ පමණක් වන්නේ
   (1) A හා B ය.   (2) B හා C ය.   (3) C හා D ය.   (4) A හා E ය.

PAST PAPERS WIKI

31. යුරෝපයේ පුනරුදය ඇතිවීමට බල පෑ ආසන්න ම හේතුව සේ සැලකෙන්නේ
(1) මානව හිතවාදී පාප්වහන්සේ නමක වූ පස්වන නිකලස් පාප්තුමා වතිකානුවේ පුස්තකාලය ගොඩ නැගීම ය.
(2) ඉතාලියේ බිහි වූ විශ්වවිද්‍යාල මගින් ශාස්ත්‍රීය නවෝදයට අවශ්‍ය බුද්ධිමය පරිසරය ගොඩ නැගීම ය.
(3) ක්‍රි.ව. 1453 දී ඔටෝමන් තුර්කිවරුන් විසින් නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර වූ කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම ය.
(4) දෙළොස්වන සියවස පමණ සිට යුරෝපයේ වෙළෙඳම වර්ධනය වීම ය.

32. පුනරුද සමයේ චිත්‍ර ශිල්පියකු පමණක් නොව සංගීතඥයකු, ප්‍රායෝගික ඉංජිනේරුවරයකු මෙන්ම විද්‍යාඥයකු ද වශයෙන් ප්‍රසිද්ධියට පත් වූ පුද්ගලයා
(1) ලියනාඩෝ ඩා වින්චි ය.
(2) මයිකල් ඇංජිලෝ ය.
(3) රෆායල් ය.
(4) පෙට්රාක් ය.

33. පහළොස්වන සියවසේ සිට ම විවිධ රටවල් දේශ ගවේෂණ කටයුතුවල නිරත වූ අතර එම රටවල් අතුරෙන් බටහිර ඉන්දීය දූපත් හා ඇමෙරිකාව සොයා ගැනීමේ ගෞරවය හිමි වන්නේ
(1) පෘතුගාලයට ය. (2) ස්පාඤ්ඤයට ය. (3) ඕලන්දයට ය. (4) ප්‍රංශයට ය.

34.

| I තීරුව | II තීරුව |
|---|---|
| (i) උපයෝගිතාවාදය | A - සියල්ලට ම වඩා මුදල් වැදගත් ය. |
| (ii) මානවවාදය | B - ලාභය පදනම් කොට ආර්ථිකය මෙහෙයවීම |
| (iii) වාණිජවාදය | C - වැඩි ම ප්‍රයෝජනවත් දේ උසස් කොට සැලකීම |
| | D - සියල්ලට ම වඩා මිනිසා වැදගත් ය. |

යුරෝපයේ විවිධ අවස්ථාවන්හි ඇති වූ මතවාද කිහිපයක් ඉහත I තීරුවේ ද, ඒ හා සම්බන්ධ ප්‍රකාශ II තීරුවේ ද දක්වේ. I තීරුව අනුව II තීරුව සැකසූ විට ගැළපෙන පිළිතුර තෝරන්න.
(1) CDA (2) CBD (3) BCD (4) ADC

35. පොදු අවශ්‍යතා ඉටු කර ගැනීමේ අරමුණින් කලාපීය වශයෙන් සංවිධාන ගොඩ නගා ගැනීම දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. නිදහස ලැබූ බ්‍රිතාන්‍ය යටත් විජිත ඉදිරි කාලයේදී සහයෝගයෙන් කටයුතු කිරීමේ අරමුණින් ගොඩනගන ලද සංවිධානය
(1) සාර්ක් සංවිධානයයි.
(2) පොදු රාජ්‍ය මණ්ඩලයයි.
(3) නොබැඳි ජාතීන්ගේ සංවිධානයයි.
(4) ආසියාන් සංවිධානයයි.

36. දෙවන ලෝක යුද්ධයෙන් පසු විවිධ රටවල් අතර වූ අර්බුද වළක්වා ගැනීමට එක්සත් ජාතීන් සමත් වුව ද ඔවුන්ගේ ඇතැම් ප්‍රයත්න අසාර්ථක වූ බවට නිදසුනක් ලෙස දැක්විය හැක්කේ
(1) කොරියානු අර්බුදයයි.
(2) ගල්ෆ් අර්බුදයයි.
(3) කම්පුචියානු අර්බුදයයි.
(4) රුවන්ඩා අර්බුදයයි.

37. දෙවන ලෝක යුද්ධයෙන් පසු යටත් විජිතවලට නිදහස ලබා දීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය උනන්දු වූයේ
(1) එම රටවල ප්‍රජාතන්ත්‍රවාදී නිදහස තහවුරු කිරීමට ය.
(2) එම රටවල තිබූ සම්පත්වලින් ප්‍රයෝජන ලබා ගැනීමට ය.
(3) යුරෝපයේ යටත් විජිත හිමි බලවතුන්ගේ බලය උපක්‍රමශීලීව බිඳ දමා තමන්ට ලෝක දේශපාලනයේ ප්‍රමුඛයා වීමට ය.
(4) යුද්ධයෙන් පීඩා විඳි යටත් විජිතවල ආර්ථික සංවර්ධනය ඇති කිරීමට ආධාර උපකාර කර ඒවායේ පක්ෂපාතිත්වය තමන් වෙත ලබා ගැනීමට ය.

38. ක්‍රි.ව. 1948 දී සම්මත කර ගන්නා ලද 'බැල්ෆර් ප්‍රකාශනය' මගින් ලෝක දේශපාලනයේ ඇති වූ සිදුවීම වන්නේ
(1) කොරියාව දෙකඩ වීමයි.
(2) ජර්මනිය දෙකඩ වීමයි.
(3) ඊශ්‍රායලය බිහිවීමයි.
(4) රුසියාවේ සාර් පාලනය අවසන් වීමයි.

39.
- මහ ලේකම් පත් කිරීම
- ජාත්‍යන්තර අධිකරණයේ විනිශ්චයකරුවන් පත් කිරීම
- එක්සත් ජාතීන්ගේ සංවිධානයට නව සාමාජිකයන් බඳවා ගැනීම

ඉහළ සඳහන් කාර්යයන් අයත් වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කිනම් ආයතනයකට ද?
(1) මහා මණ්ඩලය
(2) ආරක්ෂක මණ්ඩලය
(3) ආර්ථික හා සමාජීය කටයුතු මණ්ඩලය
(4) ජාත්‍යන්තර අධිකරණය

40. සෝවියට් රුසියාව බිඳ වැටීම නිසා ඇති වූ ප්‍රතිඵල අතුරෙන් ලෝකයට වඩාත් ම අහිතකර බලපෑම වූයේ
(1) වෝර්සෝ සංවිධානය විසුරුවා හැරීම ය.
(2) සමාජවාදී බල කඳවුර බිඳ වැටීම ය.
(3) සමාජවාදී රටවලට ආධාර නොලැබී යාම ය.
(4) ලෝක බල තුලනය අහෝසි වීම ය.

PAST PAPERS WIKI

2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 1 | 21. | 1 |
| 02. | 3 | 22. | 2 |
| 03. | 4 | 23. | 3 |
| 04. | 2 | 24. | 2 |
| 05. | 2 | 25. | 3 |
| 06. | 1 | 26. | 2 |
| 07. | 1 | 27. | 4 |
| 08. | 3 | 28. | 2 |
| 09. | 4 | 29. | 2 |
| 10. | 1 | 30. | 2 |
| 11. | 2 | 31. | 3 |
| 12. | 4 | 32. | 1 |
| 13. | 1 | 33. | 2 |
| 14. | 1 | 34. | 1 |
| 15. | 3 | 35. | 2 |
| 16. | 1 | 36. | 2 |
| 17. | 1 | 37. | 3 |
| 18. | 3 | 38. | 3 |
| 19. | 4 | 39. | 1 |
| 20. | 3 | 40. | 4 |


**වගුව 05**

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 80කි.


I පත්‍රය සඳහා අවසන් ලකුණු $= \frac{80}{2} = 40$

PAST PAPERS WIKI

### 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව




| විෂය ක්ෂේත්‍ර | ප්‍රශ්න සංඛ්‍යාව | පහසුතාව වැඩිම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව |
|---|---|---|---|
| ලංකා ඉතිහාසය | 23 | 2 (74%) | 21 (27%) |
| ලෝක ඉතිහාසය | 17 | 24 (85%) | 36 (30%) |




2013 වර්ෂයේ ඉතිසාහය I ප්‍රශ්න පත්‍රය සැකසීමේ දී ලංකා ඉතිහාසය කොටසට ප්‍රශ්න 23ක් ද ලෝක ඉතිහාසය කොටසට ප්‍රශ්න 17ක් ද ඇතුළත් වී ඇත. ලංකා ඉතිහාසයේ සමස්ත පහසුතාව 52%ක් ද ලෝක ඉතිහාසයේ සමස්ත පහසුතාව 51%ක් ද වශයෙන් ආසන්න අගයක් ගෙන තිබීම සුවිශේෂී වේ.

ලංකා ඉතිහාසය කොටසේ සමස්ත පහසුතාව වූ 52%ක පහසුතාව කෙරෙහි 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා තිරස් හා සිරස් සමෝධානික වශයෙන් හඳාරනු ලබන විෂය කරුණු වන ශ්‍රී ලංකාවේ පිහිටීම, ප්‍රාග් ඓතිහාසික ස්ථාන පිළිබඳ තොරතුරු, ආර්ථික ආගමික හා සමාජයීය සිදුවීම් සහ ඒවාට සම්බන්ධ රජවරු, සෙල්ලිපිවල අන්තර්ගත තොරතුරු හා ජාතික ව්‍යාපාරය සම්බන්ධ නායකයින් යන තේමාවන් ඔස්සේ දැනුම පදනම් කරගත් ප්‍රශ්න සකස් වී තිබීම බලපා ඇත.

ලෝක ඉතිහාසයට සම්බන්ධ ප්‍රශ්නවල පහසුතාව ද 51%ට ආසන්න අගයක් පෙන්වා ඇත. එහි දී ඉන්දියාවට ආර්යයන්ගේ පැමිණීම සම්බන්ධ දුර්ග මාර්ග, ඉන්දියාවේ ශ්‍රේෂ්ඨතම නිර්මාණයක් වූ ටජ් මහල, මහා අක්බාර් රජතුමා යුරෝපයේ පුනරුදය හා විවිධ අවස්ථාවල ඇති වූ මතවාද ආදී මාතෘකා හා සම්බන්ධ විෂය සන්ධාරවලට අදාළ දැනුම මැනෙන ආකාරයට මූලික වශයෙන් දැනුම පදනම් කරගෙන ගැටලු ඉදිරිපත් වී තිබුණි. ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී මෙම විෂය කරුණුවලට වැඩි අවධානයක් යොමු වීම නිසා ලෝක ඉතිහාසය කොටසට අයත් ප්‍රශ්නවල සමස්ත පහසුතාව 51%ට ආසන්න වී ඇති බව පැහැදිලිය. පොදුවේ ලංකා ඉතිහාසය හා ලෝක ඉතිහාසය සම්බන්ධ ඉහත මාතෘකා පිළිබඳ ව නිරන්තරයෙන් සාකච්ඡා කිරීම ද මෙම තත්ත්වයට හේතු වී ඇත.

2.1.5 **I** ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 |
| 1 | 1 | **44%** | 12% | 26% | 18% |
| 2 | 3 | 6% | 16% | **74%** | 4% |
| 3 | 4 | 13% | 8% | 20% | **59%** |
| 4 | 2 | 7% | **63%** | 25% | 5% |
| 5 | 2 | 5% | **69%** | 12% | 14% |
| 6 | 1 | **48%** | 18% | 16% | 18% |
| 7 | 1 | **31%** | 17% | 26% | 26% |
| 8 | 3 | 7% | 14% | **73%** | 6% |
| 9 | 4 | 9% | 20% | 16% | **55%** |
| 10 | 1 | **60%** | 16% | 14% | 10% |
| 11 | 2 | 16% | **68%** | 6% | 10% |
| 12 | 4 | 12% | 20% | 23% | **45%** |
| 13 | 1 | **50%** | 6% | 21% | 23% |
| 14 | 1 | **42%** | 17% | 26% | 15% |
| 15 | 3 | 8% | 23% | **52%** | 17% |
| 16 | 1 | **42%** | 10% | 18% | 30% |
| 17 | 1 | **56%** | 12% | 7% | 25% |
| 18 | 3 | 16% | 13% | **51%** | 20% |
| 19 | 4 | 27% | 21% | 17% | **35%** |
| 20 | 3 | 17% | 17% | **46%** | 20% |
| 21 | 1 | **27%** | 17% | 39% | 17% |
| 22 | 2 | 16% | **60%** | 9% | 15% |
| 23 | 3 | 31% | 10% | **52%** | 7% |
| 24 | 2 | 3% | **85%** | 8% | 4% |
| 25 | 3 | 38% | 8% | **40%** | 14% |
| 26 | 2 | 5% | **77%** | 12% | 6% |
| 27 | 4 | 9% | 9% | 12% | **70%** |
| 28 | 2 | 9% | **38%** | 41% | 12% |
| 29 | 2 | 16% | **31%** | 41% | 12% |
| 30 | 2 | 17% | **49%** | 23% | 11% |
| 31 | 3 | 8% | 12% | **66%** | 14% |
| 32 | 1 | **46%** | 38% | 9% | 7% |
| 33 | 2 | 21% | **50%** | 16% | 13% |
| 34 | 1 | **71%** | 11% | 10% | 8% |
| 35 | 2 | 16% | **55%** | 25% | 4% |
| 36 | 2 | 29% | **30%** | 20% | 21% |
| 37 | 3 | 16% | 11% | **43%** | 30% |
| 38 | 3 | 15% | 23% | **39%** | 23% |
| 39 | 1 | **57%** | 12% | 9% | 22% |
| 40 | 4 | 16% | 20% | 22% | **42%** |

**වගුව 06**

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

PAST PAPERS WIKI

### 2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

2013 ඉතිහාසය I පත්‍රය සකස් කිරීමේ දී ලංකා ඉතිහාසය කොටසට ප්‍රශ්න 23ක් ද ලෝක ඉතිහාසය කොටසට ප්‍රශ්න 17ක් ද ඇතුළත් කර තිබිණි.

ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් අසා ඇති 2, 4, 5, 8 හා 11 යන ප්‍රශ්නවල පහසුතා 60% ඉක්මවා ඇති අතර, එයින් ද 70%කට වැඩි පහසුතා 2 හා 8 ප්‍රශ්න සඳහා දක්වා ඇත. ලංකා ඉතිහාසය කොටසේ 2 වන ප්‍රශ්නයේ පහසුතාව 74%කි. එසේ වීමට හේතු වී ඇත්තේ ප්‍රාග් ඓතිහාසික ලෙන් පිළිබඳ සිසුන් තුළ පැවති නිරවුල් අවබෝධය යි. දී ඇති ප්‍රාග් ඓතිහාසික ස්ථාන හා එම ස්ථානවල වැදගත්කම ආදි තොරතුරු සරල විෂයය කරුණු බැවින්, පිළිතුරු සැපයීමට පහසු වී ඇත. 8 වන ප්‍රශ්නයේ පහසුතාව 73%කි. වාරි තාක්ෂණය පිළිබඳ තොරතුරු විමසා ඇති එම ප්‍රශ්නය සඳහා දී ඇති වරණ අතරින් ඇළ මාර්ග සම්බන්ධයෙන් වඩා වැදගත් වූ ගංගාව මහවැලි ගංගාව නිසා නිවැරදි පිළිතුර වශයෙන් තේරීම පහසු වී ඇත.

ලංකා ඉතිහාසය කොටසේ 7, 19 හා 21 ප්‍රශ්නවල පහසුතා 40%ට අඩු අගයක් ගෙන ඇති අතර ඒ අතරින් අඩු ම පහසුතාව පෙන්වන්නේ 21 වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 27%කි. මෙම ප්‍රශ්නයේ වැඩි ම ප්‍රතිචාර වන 39%ක් දක්වා ඇත්තේ වැරදි වරණයක් වූ ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලට වීම සැලකිල්ලට භාජනය විය යුතු තත්ත්වයකි. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ඒවායේ ව්‍යවස්ථාදායක විධායක බලතල පිළිබඳව නිරවුල් අවබෝධයක් නොමැති වීම නිසා වැරදි වරණයකට වැඩි ප්‍රතිචාර දක්වා ඇත. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා පිළිබඳ ව ඉගෙන ගැනීමේ දී කරුණු වෙන්කර හඳුනාගත යුතු ව ඇත. ඒ සඳහා වගු සටහන් යොදා ගැනීමත් ඒවා නිතර දැකිය හැකි වන සේ පංති කාමරයේ දී ප්‍රදර්ශනය කිරීමත් සුදුසු ය. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතර පවතින වෙනස්කම් ඒවායේ යහපත අයහපත් ලක්ෂණ ඉස්මතු වන සේ වාද විවාද පැවැත්වීම ද රුචිකත්වයෙන් යුතුව විෂය කරුණු ඉගෙනීමට යොදා ගත හැකි සාර්ථක ක්‍රමයකි.

19 වන ප්‍රශ්නයෙන් බ්‍රිතාන්‍ය පාලන සමයේ සිදු වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ව අසා ඇති අතර එයට දක්වා ඇති පහසුතාව 35%කි. මෝර්ගන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධ විෂය දැනුම ප්‍රමාණවත් නොවීම පහසුතාව අඩු වීමට හේතු වී ඇත. මෙම විෂය කොටස්වල ප්‍රධාන මාතෘකා මෙන්ම අනුමාතෘකා සඳහා ද වැඩි අවධානයක් යොමු කරමින් ඒවායින් කෙටි ප්‍රශ්න සැකසීම හා පිළිතුරු ලිවීම තුළින් මෙවැනි ප්‍රශ්න සඳහා පහසුවෙන් පිළිතුරු සැපයීමට උනන්දු කළ හැකි වේ.

ලංකා ඉතිහාසය කොටසේ 12, 13 හා 14 යන ප්‍රශ්නවලට දක්වා ඇති පහසුතාව පිළිවෙළින් 45%, 50% හා 42%වේ. මෙය මධ්‍යස්ථ පහසුතාව පෙන්වන්නකි. ලංකා ඉතිහාසයේ යුග සම්බන්ධ කාලය, අවකාශය පිළිබඳ තොරතුරු වෙන්කර ගැනීමේ හැකියාව ඉහළ මට්ටමක නැති වීම එයට හේතුවයි. විවිධ යුග, ඒවායේ විශේෂිත සිදුවීම් වෙන්කර හඳුනාගැනීම සඳහා යුග අනුව කරුණු වෙන්කොට තොරතුරු ගොනු සකස් කිරීමෙන් සාධන මට්ටම වැඩි දියුණු කරගත හැකි ය. 15 වන ප්‍රශ්නයට දක්වා ඇති පහසුතාව 52%කි. පෘතුගීසීන් හා ලන්දේසීන් අතර ඇති කරගත් ගිවිසුම්වල ස්වභාවයන් පිළිබඳව වගු සටහන් වැනි දෑ යොදාගෙන තුලනාත්මකව කරුණු තහවුරු කර ගැනීමට යොමු කිරීම ඉහළ ප්‍රතිඵල ලබා ගැනීමට ඉවහල් වේ.

ලෝක ඉතිහාසය කොටසට 24 ප්‍රශ්නයේ සිට 40 ප්‍රශ්නය දක්වා ප්‍රශ්න ඇතුළත්ව ඇත. ඒවායින් 24, 26, 31 හා 34 ප්‍රශ්න 65%ට වැඩි පහසුතා පෙන්වන අතර, ඒවා පිළිවෙළින් 85%, 77%, 66% හා 71% යන ඉහළ ප්‍රතිශත ගැනීමට සමත් වී ඇත.

ලෝක ඉතිහාසය කොටසේ 28, 29, 36 හා 38 වැනි ප්‍රශ්නවල පහසුතා 40% ට අඩු අගයන් ගෙන ඇත. ඒ අතරින් 36 වන ප්‍රශ්නය අවම පහසුතාව පෙන්වා ඇති අතර, එය 30%කි. මින් පැහැදිලි වන්නේ ලෝකයේ මෑත කාලීන ඓතිහාසික තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සිසුන් ලබා නොමැති බවයි. මේ සඳහා මෑත කාලීන ඓතිහාසික මාතෘකා පිළිබඳ තොරතුරු ඇතුළත් විවාද වැඩසටහන්, බිත්ති පුවත්පත් සැකසීම, පුවත්පත් වාර්තා රැස් කිරීම ආදී ක්‍රියාමාර්ගවලට සිසුන් යොමු කළ යුතු ව ඇත. ලෝක ඉතිහාසය කොටසේ 29 වන ප්‍රශ්නයෙහි පහසුතාව 31%කි. එහි වැඩිම ප්‍රතිචාර ඇත්තේ වැරදි 3 වන වරණයට වන අතර, එය 41%ක් වේ. මහත්මා ගාන්ධිතුමාගේ බ්‍රිතාන්‍යයින් පිටුදැකීමේ ක්‍රියාමාර්ග පිළිබඳව සුවිශේෂීව කරුණු වෙන්කර ගැනීමේ කුසලතාව සිසුන්ට මඳ බව පෙනී යයි. ඒ නිසා මෙම විෂය කරුණු සම්බන්ධ සංකල්ප හා ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම හා ඉහළ මානසික මට්ටම් ඇගයීම සම්බන්ධයෙන් වූ අභ්‍යාස කිරීමේ කුසලතාව තව දුරටත් වර්ධනය කළ යුතු වේ.

PAST PAPERS WIKI

ලෝක ඉතිහාසය කොටසේ ප්‍රශ්න අංක 30, 33, 35 හා 37 ප්‍රශ්න පිළිවෙළින් පහසුතාව 49%, 50%, 55% හා 43% වශයෙන් පෙන්වා ඇත. මෙය මධ්‍යස්ථ තත්ත්වයකි. යුරෝපා ඉතිහාසය සම්බන්ධයෙන් වූ 30 සහ 33 ප්‍රශ්නවලින් අසා ඇති කරුණු තුලනාත්මකව විමර්ශනය කර ගැනීමේ හැකියාව නොමැති වීම සාධන මට්ටම අඩු වීමට හේතු වී ඇති බව පෙනේ. ලෝක දේශපාලනය හා කාලීන තොරතුරු පිළිබඳ ව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ තොරතුරු ගවේශනය තුළින් තවදුරටත් දැනුම වර්ධනය කර ගත හැකි ය.

ප්‍රශ්න අංක 35 හා 37 ප්‍රශ්න සම්බන්ධයෙන් මධ්‍යස්ථ පහසුතාව පෙන්වීමට හේතු වී ඇත්තේ ලෝක සංවිධානවල සුවිශේෂී අරමුණු පිළිබඳවත් ප්‍රබල රටවල්වල ක්‍රියාමාර්ග පිළිබඳවත් ඉහළ මට්ටමේ දැනුමක් සිසුන් තුළ නොමැති වීමයි. මේ සම්බන්ධව විෂය කරුණු ගවේශනයට යොමු කිරීම තුළින් ඉහළ සාධන මට්ටමකට ළඟාවීමට හැකි වේ.

විෂය කරුණුවලට අදාළ පුද්ගලයන්, සිදුවීම් ආදිය පිළිබඳ ව ක්ෂේත්‍රපොත් සකස් කරවීම, කරුණුවල සුවිශේෂී බව පිළිබඳ වැඩි අවධානය යොමු කරවීම, කෙටි ප්‍රශ්න පත්‍ර පොත් සකස් කරවීම, රජවරුන්ගේ තොරතුරු හා වර්ෂ පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු ලබා දීම සිදු කළ යුතුව ඇත. කාලය හා අවකාශය පිළිබඳ අවබෝධය ලබා දෙමින් සිදුවීම් පිළිබඳ සාකච්ඡා කිරීම තුළින් ද සාධන මට්ටම ඉහළ නැංවිය හැකි ය. බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු වශයෙන් දී ඇති වරණ පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කරමින් වරණ අතර වෙනස්කම් අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු තෝරාගැනීමට මඟ පෙන්වීම ද තව දුරටත් කළ හැකි ය.

ලංකා හා ලෝක ඉතිහාසයේ දේශපාලන ආර්ථික හා සමාජ සිදුවීම් පිළිබඳව කාල වකවානු අනුව තුලනාත්මකව කරුණු ගවේශනයට අවස්ථා සම්පාදනය කළ යුතු වේ. වැදගත් සිදුවීම් ලේඛනගත කර පංතිකාමරයේ ප්‍රදර්ශනය කිරීම ද දෛනිකව පංතිකාමරයේ දී අවධානය කරන විෂය කරුණු කෙටි ප්‍රශ්න හා පිළිතුරු ආශ්‍රයෙන් බිත්ති පුවත්පත්වල ප්‍රදර්ශනය කිරීම හා සමාජවිද්‍යා සමිතිවලදී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් මගින් ඉතිහාස විෂයයේ කරුණු තවදුරටත් තහවුරු කර ගැනීමට අවස්ථා සලසා දීමට කටයුතු කිරීම යනාදී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් විෂයය සාධන මට්ටම ඉහළනංවාගත හැකි වේ.

PAST PAPERS WIKI

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 03යි. මුළු ලකුණු 120යි.**

II ප්‍රශ්න පත්‍රය I, II හා III ලෙස ප්‍රධාන කොටස් 3කින් යුක්තය.

**I කොටස**

පළමුවන ප්‍රශ්නය පමණක් මෙම කොටසට අයත් වන අතර, එය (අ) සහ (ආ) ලෙස කොටස් දෙකකින් යුක්ත අනිවාර්ය ප්‍රශ්නයකි. (අ) කොටසට ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන 10ක් ලකුණු කර නම් කිරීම ද ලෝක ආකෘති සිතියම් කොටසක ඓතිහාසික ස්ථාන 8ක් ලකුණු කර නම් කිරීම ද අපේක්ෂිතය. ඒ සඳහා ලකුණු 10 සහ 8ක් ලෙස ලකුණු 18ක් වෙන් කෙරේ. (ආ) කොටසට පින්තූර ආශ්‍රිත හා ඓතිහාසික සිදුවීම්වලට අදාළව කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ලකුණු 12ක් ද වෙන් කෙරේ.

**II කොටස**

මෙම කොටස ලංකා ඉතිහාසයට අදාළව ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 5කින් යුක්ත වන අතර ඉන් 3කට පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් මුළු ලකුණු 54ක් වෙන් කෙරේ.

**III කොටස**

මෙම කොටස ඉන්දීය, යුරෝපා හා ඈත පෙරදිග ආසියානු රටවල ඉතිහාසයට අදාළව ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 4කින් යුක්ත අතර ඉන් 2කට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 18 බැගින් මුළු ලකුණු 36ක් වෙන් කෙරේ.

II පත්‍රය සඳහා මුළු ලකුණු $= 30 + 54 + 36 = 120$

II පත්‍රයට අවසාන ලකුණ $= \frac{120}{2} = 60$

PAST PAPERS
WIKI

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

| |
|---|
| II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1, 4.2, හා 4.3 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත. |

1 ප්‍රශ්නය

## I කොටස

**1. (අ)** පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) හුරුළු වැව, කැලණි ගඟ, දඹකොළපටුන, මන්නාරම, මිහිපේ අමුණ, කසාතොට, දීඝවාපි, දේවනගර, පුත්තලම, මාතලේ අළු විහාරය. *(ලකුණු10 යි)*

(ii) තාම්‍රලිප්ති, නර්මද ගඟ, පෝක් සමුද්‍ර සන්ධිය, බෝරෝබුදූර්, රෝමය, කොරියානු අර්ධද්වීපය, කොන්ස්තන්තිනෝපලය, සූවස් ඇළ. *(ලකුණු 08 යි)*

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්ද'යි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - මල්වතු ඔයේ අතු ගංගාවක් වන ගම්භීර නදිය ආශ්‍රිතව ආර්ය ජනපදයක් පිහිටු වූ විජය රජුගේ ඇමතිවරයා

*B* - ක්‍රි.ව. දෙවැනි සියවසේදී පමණ ශ්‍රී ලංකාව ද ඇතුළත් කොට ලෝක සිතියමක් නිර්මාණය කළ ග්‍රීක ජාතික භූගෝල විද්‍යාඥයා


*C* - ශ්‍රී ලංකාවේදී පැවිදි බව ලැබූ පළමු රාජකීය කාන්තාව

*D* - නිදහස් ලංකාවේ ප්‍රථම අගමැතිවරයා *(ලකුණු 04 යි)*

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අංක අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* වලින් දක්වෙන නිර්මාණය හැඳින්වෙන නම කුමක් ද?
2. මෙය පිහිටා ඇති රට කුමක් ද?
3. මෙය කවර ගෘහ නිර්මාණ කලාවකට අයත් වූවක් ලෙස සැලකේ ද?
4. මෙම නිර්මාණය කරවන ලද්දේ යැයි සැලකෙන රජතුමා කවරෙක් ද?


*(ලකුණු 04 යි)*



*A*

(iii) 1. *B* වලින් දක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?
2. මෙය කුමන ආගමක් හා සම්බන්ධ ද?
3. මෙය ශ්‍රී ලංකාවේ කවර ඓතිහාසික යුගයකට අයත් ද?
4. මෙහි දක්නට ලැබෙන වාස්තු විද්‍යා ශෛලිය කුමක් ද?

*(ලකුණු 04 යි)*




*B*

PAST PAPERS WIKI

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1 ප්‍රශ්නය


**(1) (අ) (i)**




PAST PAPERS WIKI

(ලකුණු 10)

(1) (අ) (ii)




(ලකුණු 08යි)


(ආ) (i) A - උපතිස්ස ඇමති/ උපතිස්ස
B - ක්ලෝඩියස් ටොලමි/ටොලමි
C - අනුලා දේවිය/අනුලා බිසව/අනුලා
D - ඩී.එස්. සේනානායක මහතා / D.S. සේනානායක (ලකුණු 01 × 04 = 04යි)

(ii) 1. - සාංචි ස්තූපය / සාංචි
2. - ඉන්දියාව / භාරතය / දඹදිව / ජම්බුද්වීපය
3. - මෞර්ය
4. - අශෝක අධිරාජයා / ධර්මාශෝක අධිරාජයා / අශෝක (ලකුණු 01 × 04 = 04යි)

(iii) 1. - ශිව කෝවිල / ශිව දේවාලය / අංක 2 ශිව දේවාලය
2. - හින්දු ආගම / ශිව ආගම / ශෛව
3. - පොළොන්නරු යුගය
4. - චෝළ / සොළී (ලකුණු 01 × 04 = 04යි)

PAST PAPERS WIKI


1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




1 ප්‍රශ්නය අනිවාර්ය වුවත් පිළිතුරු සපයා ඇත්තේ 99%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 16 - 22 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 23 - 30 ප්‍රාන්තරයේ 10%ක් ද

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 23 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 10%ක් වන අතර 26%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අනුකොටස් 14ක් ඇති අතර ඉන් අනුකොටස් 7ක පහසුතාව 70%කට වැඩිය. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (ii) 2 වන අතර එහි පහසුතාව 86%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (ආ) (iii) 4ය. එහි පහසුතාව 17%කි.

මෙම ප්‍රශ්නයට අනුකොටස් 14ක් ඇති අතර, ඉන් අනුකොටස් 7ක පහසුතා 70%ට වැඩිය. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (ii) වන අතර, එහි පහසුතාව 86%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (ආ) (iii) 4 යි. එහි පහසුතාව 17%කි.

පළමු ප්‍රශ්නයේ (ආ) කොටසේ (i) B, D, (ii) 1, 2, 4 හා (iii) 1, 2 යන අනුකොටස් වැඩි පහසුතා දක්වා ඇති අතර එය 70% වැඩිය. මේ අනුව (ආ) (ii) 1 හා 2 කොටස්වල පහසුතා පිළිවෙළින් 84% හා 86% බැගින් වේ. මේ සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෞර්ය පාලකයෙකු වන ධර්මාශෝක රජතුමාගේ පාලන කාලයේ දී අපේ රටට බුදුදහම ගෙන ඒම, විධිමත් රාජ්‍යත්වය ලැබීම වැනි සුවිශේෂී කරුණුත් සමඟ සාංචි ස්ථූපය පිළිබඳව නිරන්තර සාකච්ඡාවන බැවින් ද එම පිංතූරය මතකයේ රැඳීමට හේතු වී ඇත. (ආ) කොටසේ (iii) හි 1, 2 හා 3 අනුකොටස්වල පහසුතා පිළිවෙළින් 72%, 83% හා 67% වැනි ඉහළ අගයන් දක්වා ඇත. පොළොන්නරු රාජධානියේ ආගමික තොරතුරු හා ආගමික සිද්ධස්ථාන පිළිබඳව කරුණු සාකච්ඡා කිරීමේ දී හින්දු ආගම හා ඒ සම්බන්ධ ගොඩනැගිලි පිළිබඳව වැඩි අවධානයක් යොමු වී තිබීම ඉහළ පහසුතා දැක්වීමට හේතු වී ඇත.

(ආ) (ii) 3 හා (ආ) (iii) 4 අනුකොටස්වල පහසුතාව 25%ට වඩා අඩු බව පෙනේ. ඒ ඒ නිර්මාණවල වාස්තු විද්‍යාත්මක ශෛලිය පිළිබඳ දැනුම සිසුන්ට ඉතා අඩුවීම හා එම ක්ෂේත්‍ර පිළිබඳ අවධානය අඩු වීම ඊට හේතුවයි. එම වාස්තු විද්‍යාත්මක ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම කළ යුතු බව පෙනේ. සිතියම් ලකුණු කිරීමේ දී දක්වා ඇති පහසුතාව ලංකා සිතියම සඳහා 36%ක් ද ලෝක සිතියම සඳහා 33%ක් ද වේ. මෙහි දී විෂය නිර්දේශයට අදාළ හා කාලීන වැදගත්කමක් ඇති ස්ථාන, ඓතිහාසික ස්ථාන නිශ්චිතව ලකුණු කිරීමේ හැකියාව අඩු බව පෙනේ.

පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ ඒ පාඩම් ඒකක හා බැඳුණු ඓතිහාසික ස්ථාන, කාලීන වැදගත්කමක් ඇති ස්ථාන, ගංගා, වැව්, අමුණු, ඇළමාර්ග හා කඳුවැටි නිවැරදි ව ලකුණු කිරීමේ කුසලතාව වැඩි දියුණු කිරීම, පංති කාමරයේ දී නිරන්තර සිතියම් අභ්‍යාසවල යෙදවීම හා නිසි මඟ පෙන්වීම, නිවැරදිව ස්ථාන ලකුණු කරන ලද සිතියම් ප්‍රදර්ශනය කිරීම, නිවැරදිව සිතියම් ලකුණු කිරීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ ව කුසලතාව ලබා දීම, ලංකාවේ හා ලෝකයේ ඓතිහාසික ස්ථාන පිහිටීම හඳුනාගැනීමට පහසුවන කෙටි වාක්‍ය ලියවීම හා සිතියම් ලකුණු කිරීම, විෂය නිර්දේශයට අදාළ පින්තූර ආශ්‍රිත සරල ප්‍රශ්න ඇතුළත් කුඩා පොත් පිංචක් නිර්මාණයට උපදෙස් ලබා දීම, සිසුන් ලවා සිතියම් ගොනුවක් සකස් කරවීම, ක්ෂේත්‍ර චාරිකාවලදී පූර්ව දැනුවත් කිරීමක් සහිතව සුවිශේෂී ස්ථාන නැරඹීම සඳහා යොමු කිරීම ආදී ක්‍රියාමාර්ග ගැනීම මඟින් විෂය කෙරෙහි උනන්දුව වැඩි කිරීම තුළින් විෂය දැනුම මෙන්ම සිතියම් ලකුණු කර නම් කිරීමේ කුසලතාව සංවර්ධනය කිරීමට පුළුවන.

PAST PAPERS WIKI

# II කොටස

**2 ප්‍රශ්නය**

**නිපුණතාව : අනුරපුර යුගයේ මුල් කාලයේ දී සිදු වූ ආර්ය සංක්‍රමණ, ඔවුන් පරිසරය ජයගත් ආකාරය හා දේශපාලන කටයුතු පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම**

**2.** (i) පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකාවට ගොඩබට ආර්ය කණ්ඩායම් තුනකි.

*A* - විජය ඇතුළු පිරිස    *B* - පඬුවස්දෙව් ඇතුළු පිරිස    *C* - භද්දකච්චායනා ඇතුළු පිරිස

මොවුන් ගොඩබට ස්ථාන *A*, *B* හා *C* අනුපිළිවෙලින් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) ආර්යයන් තම ජනාවාස පිහිටුවීම සඳහා තෝරාගත් ගංගා නිම්න අතුරෙන්

*A* - ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළට ගලාබසින ගංගා **දෙකක්** ද

*B* - නැගෙනහිර වෙරළට ගලා බසින ගංගා **දෙකක්** ද සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ජනපද පිහිටුවා ගත් ආර්යයන් පසුකාලීනව ජල සම්පාදන ව්‍යාපාර ආරම්භ කිරීම කෙරෙහි තම අවධානය යොමු කළේ ඇයි දැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

(iv) පණ්ඩුකාභය රජතුමා රටතුළ දේශපාලන ඒකාබද්ධතාවක් හා ක්‍රමවත් පාලනයක් ඇති කිරීමට ක්‍රියා කළ ආකාරය නිදසුන් **තුනක්** සපයමින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**2.** **(i)** *A* - තම්බපණ්ණිය / තම්මැන්නාව

*B* - කම්මල්තොට / මහකන්දර නදී (මා ඔය) මුවදොර

*C* - ගෝකණ්ණ / ත්‍රිකුණාමලය / ගෝණගාමක

**(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - කදම්බ නදී, (මල්වතු ඔය, අරුවි අරු) ගෝන නදී (කළා ඔය), මෝදරගම් ආරු

*B* - ගාල්හ නදී (ගල් ඔය), මහා වාලූකා නදී (මහවැලි ගඟ), යාන් ඔය

**(ලකුණු 02 × 02 = 04යි)**

**(iii)**
- ★ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය, වී වගාව වීම
- ★ ගංගා ජලය, වී වගාවට ප්‍රමාණවත් නොවීම
- ★ වර්ෂාව අවුරුද්දේ එක් කාලයකට සීමාවීම, වර්ෂාව කෙටි කාලයකට සීමා වීම
- ★ ලැබෙන වර්ෂාපතනය ප්‍රමාණවත් නොවීම
- ★ වර්ෂාවේ අවිනිශ්චිත බව
- ★ ජන සංඛ්‍යාව වැඩි වීම නිසා ආහාර නිෂ්පාදනය පුළුල් කළ යුතු වීම

**(ලකුණු 02 × 02 = 04යි)**


**(iv)**
- ★ වයඹ සහ නැගෙනහිර ස්වාධීන ජනපද එකතුකොට ඒකීය පාලනයක් ඇති කිරීම
- ★ ආර්ය හා දේශීය ජන කොටසක් අතර එකමුතුකමක් ඇති කිරීම
- ★ අනුරාධපුර නගරය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම
- ★ එහි සැලසුම් සහගත සංවිධානයක් නිර්මාණය කිරීම
- ★ විධිමත් පාලන සංවිධානයක් ඇති කිරීම
- ★ දිවයින පුරා ග්‍රාම සීමා නියම කිරීම
- ★ ගම් පාලනය විධිමත් කිරීම

**(ලකුණු 03 + 03 = 06යි)**

PAST PAPERS WIKI

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය





2 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 81%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 14%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 14%ක් වන අතර, 34%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.

2 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 7 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (i) *A* වන අතර එහි පහසුතාව 67%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (i) *B* වන අතර එහි පහසුතාව 2%කි.

අනුරාධපුර යුගයේ මුල් කාලයේ දී සිදු වූ ආර්ය සංක්‍රමණ, ඔවුන් පරිසරය ජයගත් ආකාරය හා දේශපාලන කටයුතු පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරිණි. මෙම ප්‍රශ්නය 81%ක් තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නය වැඩි දෙනෙකු තෝරා ගැනීමට වඩාත් හේතු වූයේ අනුරාධපුර මුල් යුගයේ දී සිදු වූ සංක්‍රමණ හා බැඳුණු ලංකාවේ ආර්ය ජනාවාස බිහි වීම පිළිබඳ විෂය සන්ධාරයට සිසුන් 6 ශ්‍රේණියේ සිට දක්වන රුචියයි. එහි ලකුණු 18න් 14ක් හා ඊට වැඩියෙන් ලබා ගත් පිරිස වූයේ 14%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 34%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 4ක් හෝ ඊට අඩුවෙනි.

එමෙන්ම (i) *A* අනුකොටසට වැඩිම පහසුතාවය වන 67%ක් ලබා ඇති අතර (i) *B* අනුකොටසට අඩුම පහසුතාවය වන 2%ක් ලබා ඇත. අනුකොටස් වන (i) කොටසට ඉහළ පහසුතාවක් දැක්වූවත්, (ii), (iii) හා (iv) අනුකොටස්වලට මධ්‍යස්ථ මට්ටමක පහසුතාවක් පෙන්නුම් කරයි. ආර්යයන්ගේ පැරණි ජනාවාස පිළිබඳ ව දැනුම ලබා දීමේ දී කථාන්දර, ජනවහර හා ප්‍රවෘත්ති ඇසුරින් එම විෂය කොටස් ඉගෙනුමට ඉඩ ප්‍රස්ථා ලබා දීම තවදුරටත් සිසුන්ගේ නැඹුරුව වැඩි කිරීමට හේතු වූ බව පෙනේ.

මෙහි දී (i) *B* කොටසට අදාළ පිළිතුර වූ ''කම්මල්තොට'' නම් ස්ථානය හඳුනා ගැනීමට වැඩි පිරිසක් අසමත් වීම පහසුතාව අඩු වීමට හේතු වී ඇත. මෙම විෂය කරුණ සඳහන් වන්නේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පමණි. එබැවින් ඉගැන්වීම් කටයුතුවලදී ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය ද භාවිතා කළ යුතු ව ඇත. (ii), (iii), (iv) යන කොටස්වලට පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතින බැවින් ලංකා සිතියම් උපකාර කර ගනිමින් අදාළ ගංගා හඳුනා ගැනීම, ආර්යයන්ට වාරි කර්මාන්ත අවශ්‍ය වීම පිළිබඳව හා ආර්ය ජනපද ඇසුරින් ක්‍රමවත් දේශපාලන රටාවක් තහවුරු කිරීමට පණ්ඩුකාභය කුමරු කටයුතු කළ ආකාරය පිළිබඳ සිසුන් තුළ නිරවුල් දැනුම ඇති කිරීමට අවශ්‍යව ඇත.

ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ රජවරුන්ගේ සේවාවන් සුවිශේෂී ව ආර්ථික, දේශපාලන, ආගමික හා සංස්කෘතික යනා දී වශයෙන් තවදුරටත් තහවුරු වන ආකාරයට වගු සටහන්, කරුණු පෙළ ගැස්වීම යනාදී ක්‍රම ශිල්ප ඔස්සේ ඉගෙනුමට අවස්ථාවන් සම්පාදනය කළ යුතු ව ඇත.

PAST PAPERS WIKI

### 3 ප්‍රශ්නය

**නිපුණතාව : අනුරපුර යුගයේ සිට නිරිත දෙසට රාජධානි මාරුවීම දක්වා කාලය තුළ ඇති වූ දේශපාලන, ආර්ථික, සංසිද්ධි පිළිබඳ සමස්ත අවබෝධය පිරික්සීම**

**3.** (i) පහත *A*, *B* හා *C* යටතේ දක්වෙන රාජ්‍ය පාලන කාලයන්හි දී ලංකාවට පැමිණි ආක්‍රමණිකයින් කවුරුන් දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න.

*A* - සූරතිස්ස *B* - අසේල *C* - පස්වන මිහිඳු (ලකුණු 03 යි)

(ii) පහත *A*, *B*, *C* හා *D* වලින් දක්වෙන ඓතිහාසික සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි වරහන් තුළ දී ඇති ලැයිස්තුවෙන් තෝරා පිළිවෙළින් ලියන්න.

*A* - පළමුවරට ඉන්දීය සේනාවක ආධාර ලබා, තම සහෝදරයා සමග සටන් කොට ලංකා රාජ්‍ය උරුමය ලබා ගත් තැනැත්තා

*B* - මහසෙන් රජතුමා මහායානික අදහස්වලට නැඹුරු කරවීමටත්, මහා විහාරයට විරුද්ධව කටයුතු කිරීමටත් පසුබිම සකස් කළ භික්ෂූන් වහන්සේ

*C* - පළමුවෙනි විජයබාහු රජතුමා කුමාරයකු ව සිටි කාලයේ දී රැකවරණය සැලසූ රුහුණු ප්‍රාදේශීය පාලකයා

*D* - ක්‍රි.ව. 1215 දී පොළොන්නරු රාජධානිය ආක්‍රමණය කළ පුද්ගලයා

(සංඝමිත්‍ර, මානවම්ම, පළමුවන මුගලන්, කුපික්කලතිස්ස, කාලිංග මාඝ, චන්ද්‍රභානු, බුද්දල්නා, බුවනෙකබාහු ආදිපාද) (ලකුණු 04 යි)

(iii) නිශ්ශංකමල්ල රජතුමා රාජ්‍ය බලය තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පාලන මධ්‍යස්ථාන නිරිත දිගට විතැන් වූ අවධියේදී මෙරට ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** **(i)** *A* - සේන හා ගුත්තික

*B* - එළාර

*C* - පළමුවන රාජේන්ද්‍ර / රාජේන්ද්‍ර චෝළ / රාජරාජ **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - පළමුවන මුගලන්

*B* - සංඝමිත්‍ර

*C* - බුද්දල්නා

*D* - කාලිංග මාඝ **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)**
- ★ තමා අයත් කාලිංග වංශයට රාජ්‍ය උරුමය සඳහා ඇති අයිතිය හුවා දැක්වීම, සෙල්ලම් පිහිටු වීම
  උදා:- ගල්පොත ශිලා ලේඛනය
- ★ තුලාභාර දාන දීම
- ★ බදු සහන සැලසීම
- ★ ජනතාව සමග සබඳතා පවත්වා ගැනීමට රට පුරා සංචාරය කිරීම
- ★ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම
- ★ විදේශ සබඳතා පවත්වා ගැනීම **(ලකුණු 02 + 03 = 05යි)**


**(iv)**
- ★ වී ගොවිතැනට හිමිව තිබූ ප්‍රමුඛතාවය අඩු වීම / අහස්දිය මත වී වගා කිරීම
- ★ මෙතෙක් පැවැති පාරිභෝගික කෘෂි ආර්ථික රටාව, වාණිජ ආර්ථික රටාවකට පරිවර්තනය වීමට පටන් ගැනීම
- ★ හේන් වගාව හා ගෙවතු වගාව ආර්ථිකයේ වැදගත් තැනක් ගැනීමට පටන් ගැනීම
- ★ විදේශ වෙළෙඳාම රජුගේ ඒකාධිකාරය යටතේ පැවතීම

**(ලකුණු 03 + 03 = 06යි)**

PAST PAPERS WIKI

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය





3 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 61%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 53%ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 14%ක් ද

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 14%ක් වන අතර, 53%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 4ක් හෝ ඊට අඩුවෙනි.

3 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව




3 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 09 අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (ii) *B* වන අතර එහි පහසුතාව 68%කි. එසේම පහසුතාව අඩුම කොටස (i) *C* වන අතර එහි පහසුතාව 27% කි.

මෙම ප්‍රශ්නය අනුරාධපුර යුගයේ සිට නිරිත දිගට රාජධානි මාරුවීම දක්වා කාලය තුළ ඇති වූ දේශපාලන, ආර්ථික සංසිද්ධි පිළිබඳ සමස්ත අවබෝධය පිරික්සීම උදෙසා සකස් වී ඇත. ප්‍රශ්නය තෝරා ගෙන ඇති සංඛ්‍යාව 60%කි. ප්‍රශ්නයේ කොටස් 9 තුළින් වැඩිම පහසුතාව දක්වා ඇත්තේ (ii) *D* කොටසට වන අතර එහි පහසුතාව 68%කි. පහසුතාව අඩුම කොටස (i) *C* වන අතර එහි පහසුතාව 27%කි.

පොළොන්නරු රාජධානියට කාලිංග මාඝගේ ආක්‍රමණය සිදු වීම පිළිබඳ තොරතුරු පහළ ශ්‍රේණිවල දී දැනුවත් වී තිබීමත් 10 ශ්‍රේණියේ දී ජලාශ්‍රිත ශිෂ්ටාචාරය බිඳ වැටීම සඳහා කාලිංග මාඝගේ ආක්‍රමණය බලපෑ ආකාරය සාකච්ඡා වීමත් දඹදෙණි යුගය පාඩමේ දී එම කරුණම නැවත සාකච්ඡා වීමත් නිසා සිසුන්ගේ මතකයේ රැඳී තිබීම, (ii) *D* අනුකොටසේ පහසුතාව වැඩි වීමට හේතු වී ඇත. තවදුරටත් සාධන මට්ටම වැඩි කර ගැනීම සඳහා ප්‍රශ්න හා පිළිතුරු ගොනු සකස් කිරීම සුදුසු ය.

රජවරුන් හා ඒ ඒ කාලවල දී සිදු වූ ආක්‍රමණ අතර සබඳතාව නිරවුල් අවබෝධයක් නොවීම (i) *C* අනුකොටසට අවම පහසුතාව පෙන්වීමට හේතු වී ඇත. වගු සටහන් සකස් කිරීම, ගැළපීම් වර්ගයේ ප්‍රශ්න කරවීම මගින් මේ පිළිබඳ දැනුම වැඩි දියුණු කළ හැකි ය.

මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 18න්, 0 - 4 දක්වා අඩු ලකුණු ප්‍රමාණයක් 53%ක් වැනි ඉහළ ශිෂ්‍ය ප්‍රතිශතයක් ලබා ඇත. 14-18ත් අතර ඉහළ ලකුණු ලබා ගත් සංඛ්‍යාව 14%ක් වැනි සුළු ප්‍රතිශතයකි. සමස්ත වශයෙන් ගත්කළ (iii) හා (iv) කොටස්වලට 34% හා 32% වශයෙන් අඩු පහසුතා ලබා ගැනීමෙන් පහසුතා 40%ටත් වඩා අඩු වීම නිසා වැඩි ශිෂ්‍ය ප්‍රතිශතයක් අඩු ලකුණු අතර සිටින බව දක්නට ඇත. මෙහි දී අදාළ විෂය කරුණු විස්තර කිරීමේ හැකියාව නොමැති වීමත්, කාල වකවානු පිළිබඳ නිරවුල් අවබෝධයක් නොමැති වීමත් නිසා ප්‍රශ්නයට අදාළව කරුණු ඉදිරිපත් වීම හා කරුණු විස්තර කිරීමේ දුර්වලතාව හේතු වී ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී රජවරුන්ගේ කාර්යයන් දේශපාලන, ආගමික, ආර්ථික වශයෙන් සුවිශේෂී කොට වගුගත කිරීම, එම කාර්යයන්ගේ වැදගත්කම පිළිබඳ විවාද පැවැත්වීම, රජවරුන්ගේ කාර්යයන් පිළිබඳ සමස්තය ගොඩනැගීම, රජු හා එකල පැවති ආක්‍රමණවල සබඳතාව පෙන්වීම සඳහා ගැළපීම් වර්ගයේ ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට යොමු කිරීම, කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට මඟපෙන්වීම් කළ හැකි ය.

PAST PAPERS WIKI

**4 ප්‍රශ්නය**

**නිපුණතාව : ජලාශ්‍රිත ශිෂ්ඨාචාර සමයේ ක්‍රියාත්මක වූ මධ්‍ය හා ප්‍රාදේශීය පාලනය පිළිබඳ තුලනාත්මක දැනුම හා අවබෝධය පිරික්සීම**

**4.** (i) ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පැවැති මුල් සමයේ මධ්‍යම පාලනයට අයත් පහත සඳහන් කාර්යයන් භාරව සිටි නිලධාරීන්ගේ තනතුරු නාම පිළිවෙලින් සඳහන් කරන්න.

*A* - රජුගේ භාණ්ඩාගාරය භාරව කටයුතු කිරීම *B* - රජතුමාගේ ඡත්‍රය භාරව කටයුතු කිරීම

*C* - රජුගේ හමුදාව භාරව කටයුතු කිරීම (ලකුණු 03 යි)

(ii) පාලන පහසුව සඳහා අනුරාධපුර යුගයේ දී රජරට ප්‍රදේශය ප්‍රාදේශීය ඒකක **හතරකට** බෙදා වෙන් කර තිබුණි. ඒවා නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ගමක නායකත්වය දැරූ ගමික හෙවත් ග්‍රාමභෝජකගෙන් ඉටු වූ සේවාව කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) රජතුමා වැසියන්ගේ

*A* - ආරක්ෂාව *B* - ආර්ථිකය *C* - ආගම

සම්බන්ධයෙන් ඉටු කළ සේවාව නිදසුන් **එක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.** **(i)** *A* - බඩගරික

*B* - ඡත්තග්ගාහක

*C* - සෙන්පති / සේනාපති / සෙනවිරත් **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)**
- ★ උත්තරපස්ස (උතුරු)
- ★ දක්ඛිණපස්ස (දකුණ)
- ★ පාචීනපස්ස (නැගෙනහිර)
- ★ පශ්චිමපස්ස (බටහිර) **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)**
- ★ ගමේ සාමය හා විනය පවත්වා ගැනීම
- ★ ගැමියන්ගේ සිරිත් විරිත් හා සම්ප්‍රදායන් අනුව කටයුතු කිරීම
- ★ ගමේ ආදායම් එකතු කිරීම
- ★ රජු වෙනුවෙන් බදු එකතු කිරීම
- ★ ගමේ කටයුතු ගැන රජතුමාට වගකීමට බැඳී සිටීම
- ★ ගම්වාසීන් සමග සාමුහිකව කටයුතු කිරීම
- ★ වාරිමාර්ග කටයුතු නඩත්තු කිරීම
- ★ ගමේ සුළු ආරවුල් විසඳීම
- ★ යුක්තිය පසිඳලීම **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)** *A* - ආරක්ෂාව

දේශීය හා විදේශීය සතුරන්ගෙන් රටවැසියා ආරක්ෂා කිරීම

කැරලි කෝළාහලවලින් ආරක්ෂාව ලබා දීම

*B* - ආර්ථිකය

ගොවිතැන් කටයුතු සඳහා ජල සම්පාදන පහසුකම් සැලසීම

*C* - ආගම


බුදු දහමේ උන්නතිය සඳහා වෙහෙර විහාර ගොඩනැගීම හා නඩත්තුව

භික්ෂූන් වහන්සේලාට පහසුකම් සැපයීම වැනි කාර්යයන්

පොළොන්නරු යුගයේ දී හින්දු ආගමට අනුග්‍රහ දැක්වීම **(ලකුණු 03 + 03 = 06යි)**

PAST PAPERS WIKI


## 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා:




4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 56%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 29% ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 33% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 22% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 16% ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 16%ක් වන අතර, 29%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 8 අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (iv) *A* කොටස වන අතර එහි පහසුතාව 61%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (i) *B* කොටස වන අතර එහි පහසුතාව 21%කි.

ජලාශ්‍රිත ශිෂ්ටාචාර සමයේ ක්‍රියාත්මක වූ මධ්‍ය හා ප්‍රාදේශීය පාලනය පිළිබඳ තුලනාත්මක දැනුම හා අවබෝධය පිරික්සීම සඳහා මෙම ප්‍රශ්නය සකස් වී තිබේ.

මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති සංඛ්‍යාව 56%කි. ඊට අදාළ කොටස් සංඛ්‍යාව 8කි. ඉන් වැඩිම පහසුතාව දක්වා ඇත්තේ (iv) *A* කොටස වන අතර, එය 61%කි. ඊට අමතරව (iii) කොටසට 59%ක් ද (iv) *C* කොටසට 59%ක් ද පෙන්වා ඇත. මෙහිදී අවම පහසුතාව වන්නේ (i) *B* කොටස වන අතර, එහි පහසුතාව 21%කි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ මූලික සංකල්ප පිළිබඳ දැනුමක් තිබීම හා සරල තොරතුරු ඉදිරිපත් කිරීමට හැකියාව ලැබීම නිසා (iii) කොටසට හා (iv) කොටසේ *A*, *B*, *C* අනුකොටස්වල පහසුතාව මධ්‍යස්ථ මට්ටමක විය. මෙහි දී (i) *B* අඩුම පහසුතාවට හේතු වී ඇත්තේ "ඡත්‍රය" යන සංකල්පයෙහි ඓතිහාසික පසුබිම හඳුනා ගැනීමට නොහැකි වීමයි. විෂයයට අදාළ වෙනත් පොත පත පරිශීලනයට සිසුන් තව දුරටත් යොමු කිරීම වඩාත් යෝග්‍යයි.

ප්‍රශ්නයේ (iv) කොටසේ *A*, *B*, *C* වශයෙන් අනුකොටස් කර තිබීම නිසා නිශ්චිත පිළිතුරු ලිවීමට හැකියාව ලැබී ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පාලන ව්‍යුහයන් පිළිබඳ ධූරාවලි, වගුගත සටහන් මගින් සිසුන් තවදුරටත් එම තොරතුරු අධ්‍යයනයට යොමු කරවීම පහසු වනු ඇත. සිසුන් දන්නා තොරතුරු වෙන්කර ප්‍රශ්නයට අදාළව ඉදිරිපත් කිරීමට නොහැකි වීම අඩු ලකුණක් හිමි කර ගැනීමට බලපා ඇත. පෙළපොත් හා වෙනත් ඉගෙනුම් මූලාශ්‍රවලින් රැස්කර ගන්නා තොරතුරු විශ්ලේෂණය සඳහා යොමු කිරීමෙන් මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ හුරුවක් ලබා දීමට පුළුවන.

PAST PAPERS WIKI

5 ප්‍රශ්නය

**නිපුණතාව : පෘතුගීසීන් හා ලන්දේසීන් සමග දේශීය පාලකයන් පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය පිරික්සීම**

**5.** (i) පහත *A*, *B* හා *C* වලින් දක්වෙන එක් එක් කරුණට අදාළ නිවැරදි පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - පෘතුගීසින් ලංකාවට පැමිණි අවධියේ යාපනය පාලනය කළ ආර්ය චක්‍රවර්ති පරපුරේ රජතුමා

*B* - ක්‍රි.ව. 1521 දී කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදීමට හේතු වූ ඓතිහාසික සිදුවීම

*C* - හත්වැනි බුවනෙකබාහු රජුගෙන් පසු කෝට්ටේ රජු බවට පත් වූ තැනැත්තා (ලකුණු 03 යි)

(ii) පහත කරුණු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි වරහන් තුළින් තෝරා *A*, *B*, *C* හා *D* අනුපිළිවෙළින් දක්වන්න.

*A* - පළමුවන රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කළ අවධියේ එහි සිටි පාලකයා

*B* - ක්‍රි.ව. 1638 දී ලන්දේසීන් සමග ගිවිසුමකට එළඹි උඩරට රජතුමා

*C* - උඩරට රාජධානියේ රජු බවට පත් වූ ප්‍රථම නායක්කර් වංශික රජතුමා

*D* - ක්‍රි.ව. 1602 දී ජෝරිස් ෆන් ස්පිල්බර්ජන් නම් ලන්දේසි ජාතිකයා ලංකාවට පැමිණෙන විට උඩරට රාජ්‍යයේ පාලකයා

(වීර සුන්දර බණ්ඩාර, ශ්‍රී විජය රාජසිංහ, වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ, කරලියැද්දේ බණ්ඩාර, දෙවන රාජසිංහ, පළමුවන විමලධර්මසූරිය, රාජාධිරාජසිංහ, සෙනරත්) (ලකුණු 04 යි)

(iii) පෘතුගීසීන්ට උඩරට රාජධානිය යටත් කරගැනීමට නොහැකි වූයේ ඇයිදැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ රාජ්‍ය කාලයේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**5.** **(i)** *A* - පරරාජසේකරම්

*B* - විජයබා කොල්ලය / 6 වැනි විජයබාහු රජුගේ පුතුන් තිදෙනා රජු මරා රාජ්‍යය බෙදා ගැනීම

*C* - ධර්මපාල කුමරු / දොන් ජුවන් ධර්මපාල **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - කරලියැද්දේ බණ්ඩාර

*B* - දෙවන රාජසිංහ / II රාජසිංහ

*C* - ශ්‍රී විජය රාජසිංහ

*D* - පළමුවන විමලධර්මසූරිය **(ලකුණු 01 × 04 = 04යි)**


**(iii)**
- ★ උඩරට රාජධානියේ භෞතික පරිසරය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති වීම
- ★ උඩරටියන්ගේ රාජපාක්ෂික භාවය (ප්‍රභූ, භික්ෂූන්, සාමාන්‍ය ජනතාව)
- ★ උඩරටියන්ගේ යුධ උපක්‍රම (ගරිල්ලා සටන් ක්‍රම)
- ★ ලස්කිරිඤ්ඤ හමුදා තීරණාත්මක අවස්ථාවලදී උඩරට රජුගේ පැත්ත ගැනීම
- ★ ඇතැම් උඩරට රජවරුන්ගේ රණශූරත්වය
- ★ ස්වාභාවික ගිරිදුර්ග, වන දුර්ග, ජල දුර්ග පිළිබඳ අවබෝධය අඩුවීම

**(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)**
- ★ උඩරට රාජ්‍යයේ සාමකාමී වාතාවරණයක් පවත්වා ගැනීමට ලන්දේසීන් සමග ගිවිසුමක් ඇතිකර ගැනීම
- ★ සියම් දේශයෙන් උපසම්පදාව ගෙන ඒම
- ★ වැලිවිට සංඝරාජ හිමි සමග එක්ව බෞද්ධාගමික ප්‍රබෝධයට කටයුතු කිරීම
- ★ වෙහෙර විහාර අලුත්වැඩියා කිරීම
- ★ දළදා පෙරහැරට දේවාල පෙරහර එකතු කිරීම
- ★ සංඝරාජ තනතුර ඇති කිරීම **(ලකුණු 03 + 03 = 06යි)**

PAST PAPERS WIKI


**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




5 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 57%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18 ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 54% ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 30% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 10% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 6% ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 6%ක් වන අතර, 54%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 9 අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස වන්නේ (i) *B* කොටස වේ. එහි පහසුතාව 54%වේ. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (iv) වන අතර එහි පහසුතාව 19%කි.

පෘතුගීසීන් හා ලන්දේසීන් සමග දේශීය පාලකයින් පැවැත්වූ සම්බන්ධතා පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය පිරික්සීම මෙම ප්‍රශ්නයෙන් අපේක්‍ෂා කෙරිණි. 57%ක් පමණ තෝරාගෙන ඇති මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 9ට වඩා ලබාගෙන ඇති සංඛ්‍යාවේ ප්‍රතිශතය 16%කි. එසේම තෝරාගත් පිරිසෙන් 54%ක්ම ලකුණු 4ට වඩා අඩුවෙන් ලබා ඇත. මෙම ප්‍රශ්නයේ වැඩි ම පහසුතාව දක්වන (i) *B* කොටසින් කෝට්ටේ රාජධානියේ දේශපාලන උරුමය හා බැඳුණු සංසිද්ධියක් වූ විජයබාකොල්ලය පිළිබඳ 8 ශ්‍රේණියේ පෙළ පොත මඟින් හා අදාළ පරිබාහිර පොත් මඟින් ද ලබා ගත් දැනුම ඓතිහාසික ජන කථා ඇසුරු කොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිත කිරීම ඒ පිළිබඳ දැනුම තහවුරු වීමට හේතු වී ඇත.

එහෙත් (ii) *A, B, C, D* අනුකොටස් සඳහා පිළිතුරු වරහන් තුළින් තෝරා ගැනීමට හැකියාව තිබිය දී පහසුතාව 50%කට වඩා අඩු මට්ටමක පැවතීමට හේතු වී ඇත්තේ මුහුදුබඩ පෘතුගීසී හා ලන්දේසී පාලන සමයන් හි දී උඩරට හා අනෙකුත් රාජධානිවල පාලකයින් වෙන්කොට හඳුනා ගැනීමේ දැනුම නිරවුල්ව නොතිබීමයි. මේ බව තවදුරටත් (i) *A, C* කොටස්වල පහසුතාව 30%ට වඩා අඩු වීම මඟින් ද තහවුරු වී ඇත. (ii) හා (iii) කොටස්වලින් මෙම යුගයේ දී උඩරට රාජධානියේ භෞතික හා සමාජ තොරතුරු මෙන් ද ආගමික හා දේශපාලන දියුණුවට මූලික වූ පාලකයින් පිළිබඳ ව දැනුම අයදුම්කරුවන්ට නිරවුල් ව තහවුරු වී නොතිබීම පහසුතාව ඉතා අඩු මට්ටමක පැවතීමට බලපා ඇත.

පෘතුගීසී හා ලන්දේසී පාලන අවධිවල ඒ ඒ යුගවලට අදාළ රජවරු වෙන්කොට හඳුනාගැනීමට හා දේශපාලන, ආර්ථික, ආගමික වශයෙන් එම රජවරු සම්බන්ධ සුවිශේෂි කරුණු ද පෘතුගීසී හා ලන්දේසී පාලකයින් සමග රජවරු ඇතිකරගත් සම්බන්ධතා ද වගුගත කොට ඉගෙනීමට සැලැස්වීම අවශ්‍යව ඇත. එසේම එවැනි සිදුවීම් හා සම්බන්ධ වර්ෂ ආදිය සම්බන්ධ කිරීමේ හා ඇඳීමේ අභ්‍යාසවල යෙදවීම සිදුකළ යුතුව ඇත. රජවරු හා ආක්‍රමණවල සබඳතාව පෙන්වීම සඳහා ගැළපීම් වර්ගයේ ප්‍රශ්න සඳහා යොමු කරවීම, කෙටි ප්‍රශ්න සෑදීම හා පිළිතුරු සෙවීම වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීම හා ප්‍රශ්නයට අදාළ පිළිතුර විස්තර කිරීම, පැහැදිලි කිරීම පිළිබඳ අභ්‍යාස කරවීම සුදුසු බව පෙනේ.

PAST PAPERS WIKI

**6 ප්‍රශ්නය**

**නිපුණතාව : ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ ඇති වූ දේශපාලන සංසිද්ධි පිළිබඳ දැනුම අවබෝධය හා 19 සියවසේ ඇති වූ සංස්කෘතික පුනර්ජීවය පිළිබඳ විශ්ලේෂණාත්මකව ඇගයීමේ හැකියාව පිරික්සීම**

**6.** (i) පහත A,B හා C වලින් දක්වෙන තොරතුරුවලට සම්බන්ධ එක් එක් පුද්ගලයා කවුරුන්දැයි පිළිවෙළින් ලියා දක්වන්න.

A - ක්‍රි.ව. 1803 දී උඩරට ආක්‍රමණය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා

B - උපායශීලී ක්‍රම මගින් උඩරට රාජ්‍යය ජය ගැනීම සඳහා බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාට සහාය වූ සිවිල් නිලධාරියා

C - බ්‍රිතාන්‍යයන්ගේ පරිපාලන කටයුතුවල පහසුව සඳහා කොළඹ සිට මහනුවර දක්වා මහාමාර්ගය ඉදි කිරීමට පුරෝගාමී වූ ආණ්ඩුකාරවරයා (ලකුණු 03 යි)

(ii) A - ක්‍රි.ව. 1818 නිදහස් අරගලයට මූලිකත්වය දුන් පුද්ගලයන් **දෙදෙනකු** සඳහන් කරන්න.

B - ක්‍රි.ව. 1848 නිදහස් අරගලයට හේතු වූ කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ක්‍රි.ව. 1931 ට පෙර පැවැති ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවලට වඩා ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලාංකිකයන්ට වඩා වැඩි පාලන බලතල ලැබුණු ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) A - දහනව වැනි සියවසේ ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය යටතේ

- ❊ බෞද්ධාගමික ප්‍රබෝධයක් ඇති කිරීමට පුරෝගාමී වූ භික්ෂූන් වහන්සේ නමක් ද
- ❊ හින්දු ප්‍රබෝධයක් ඇති කිරීමට පුරෝගාමී වූ එහි නායකත්වය දැරූ පුද්ගලයා ද
- ❊ ඉස්ලාම් ආගමික ප්‍රබෝධයේ මූලිකත්වය ගත් පුද්ගලයා ද

පිළිවෙළින් නම් කරන්න.

B - ඔබ නම් කළ අය අතුරෙන් කැමති එක් පුද්ගලයකුගෙන් ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයට සිදු වූ සේවාව නිදසුන් **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**6. (i)** *A* - ෆ්‍රෙඩ්රික් නෝර්ත්

*B* - ජෝන් ඩොයිලි

*C* - එඩ්වඩ් බාන්ස් **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - මොනරවිල කැප්පෙටිපොල, කොහුකුඹුරේ රටේ රාළ, මඩුගල්ලේ, බූටැවේ රටේ රාළ

*B* - ටොරින්ටන් ආණ්ඩුකාරවරයාගේ බදු ප්‍රතිපත්තිය

- 1840 මුඩුබිම් පනත මගින් උඩරට ඉඩම් රජයට පවරා ගැනීම
- ගම්සභා ක්‍රමය අහෝසි කිරීම
- වතුවගාව නිසා ගැමි ජීවන රටාව අවුල්වීම
- උසාවි ක්‍රමය ඇති කිරීම නිසා ගැමියන් විවිධ දුෂ්කරතාවලට මුහුණ පෑම
- රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
- ගොවි ජනතාව නොලසකා හැරීම **(ලකුණු 02 × 02 = 04යි)**

**(iii)** ⋆ සර්ව ජන ඡන්ද බලය

⋆ විධායක කාරක සභා ක්‍රමය

⋆ පළාත්බද නියෝජනය ක්‍රමය පුළුල් වීම

⋆ රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවා ව්‍යවස්ථාදායක හා විධායක බලතල අතර ඒකාබද්ධතාවයක් ඇති කිරීම **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)** *A* ⋆ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, වලානේ සිද්ධාර්ථ හිමි, රත්මලානේ ධර්මාලෝක හිමි

⋆ අරුමුග නාවලර්තුමා, ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන්තුමා

⋆ එම්.සී. සිද්දිලෙබ්බේ, ටී.බී. ජයා

PAST PAPERS WIKI

*B* ★ **මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි**

- පංචමහාවාද මෙහෙයවීම (පානදුරාවාදය ඉන් ප්‍රමුඛ වේ)
- වාද මගින් ඉදිරිපත් වූ කරුණු නිසා විදෙස් රටවල බෞද්ධාගම පිළිබඳ ප්‍රබෝධයක් ඇතිවීම නිසා ඕල්කොට්තුමාගේ පැමිණීම
- වාද නිසා රට තුළ බෞද්ධ ප්‍රබෝධයක් ඇති වීම

★ **හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි**

- මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවා අධ්‍යාපනික ප්‍රබෝධයක් ඇති කිරීම
- බෞද්ධ පොතපත සංස්කරණය
- පිරිවෙන් අධ්‍යාපනය තුළ පෙරදිග භාෂා අධ්‍යයනය උනන්දු කරවීම (පාලි සංස්කෘත)
- ලක්මිණි පහණ, ලංකා ලෝකය පුවත්පත් ආරම්භ කිරීම

★ **රත්මලානේ ධර්මාලෝක හිමි**

- පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ඇරඹීම
- පිරිවෙන් අධ්‍යාපනය තුළ පෙරදිග භාෂා අධ්‍යයනය උනන්දු කරවීම

★ **වලානේ සිද්ධාර්ථ හිමි**

- රත්මලානේ පරමධම්ම චෛතිය පිරිවෙන පිහිටුවීම
- පිරිවෙන් අධ්‍යාපනය තුළ පෙරදිග භාෂා අධ්‍යයනය උනන්දු කරවීම

★ **අරුමුග නාවලර්තුමා**

- බයිබලය දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම
- 1897 යාපනයේ වන්නාර් පන්නෙයිහි ඉංග්‍රීසි පාසලක් ආරම්භ කිරීම
- 1853 ශෛව පරිපාලන සභාව හා හින්දු අධ්‍යාපන සභාව පිහිටු වීම
- සම්භාව්‍ය දෙමළ කෘති මුද්‍රණය කිරීම

★ **පොන්නම්බලම් රාමනාදන්**

- ආගමික හා සංස්කෘතික පුනර්ජීවයක් ඇති කිරීම සඳහා පරමේශ්වර විද්‍යාලය හා රාමනාදන් විද්‍යාලය පිහිටු වීම

★ **එම්.සී. සිද්දි ලෙබ්බේ**

- මද්රාසා මුස්ලිම් ආගමික පාසල් ප්‍රතිසංවිධානය කිරීම
- මුස්ලිම් දරු දැරියන් සඳහා කොළඹ හා මහනුවර පාසල් ආරම්භ කිරීම
- මුස්ලිම් ජනතාවට අරාබි හා ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ අගය වටහා දීමට පියවර ගැනීම
- ''මුස්ලිම් නේෂන්'' හා ''ඥාන දීපම්'' පුවත්පත් ආරම්භ කිරීම
- කොළඹ මුස්ලිම් අධ්‍යාපන සංගමය පිහිටු වීම

★ **ජී.බී. ජයා**


- ''සිලෝන් මුස්ලිම් රිවීව්'' සඟරාවට ලියන ලද ලිපි මගින් අධ්‍යාපනයේ වැදගත්කම මුස්ලිම් ජනතාවට පෙන්වා දීම
- පිරිහෙමින් පැවති සහිරා විද්‍යාලයේ විදුහල්පති තනතුර භාර ගෙන එය නගා සිටුවීමට ක්‍රියා කිරීම

**(ලකුණු 03 + 03 = 06යි)**

PAST PAPERS WIKI

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

**6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**





6 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 43%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 31% ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 31% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 20% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 18% ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 18%ක් වන අතර, 31%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.

**6 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව**




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 8 අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (i) *A* වන අතර එහි පහසුතාව 74%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (i) *C* කොටස වන අතර එහි පහසුතාව 11%කි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ ඇති වූ දේශපාලන සංසිද්ධි පිළිබඳ දැනුම අවබෝධය හා 19 සියවසේ ඇති සංස්කෘතික පුනර්ජීවය පිළිබඳ විශ්ලේෂණාත්මකව ඇගයීමේ හැකියාව පිරික්සීම මින් අපේක්ෂිතය.

ප්‍රශ්න තෝරාගෙන ඇති සංඛ්‍යාව 43% කි. තෝරාගෙන ඇති පිරිසෙන් 62% ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 9 හෝ ඊට අඩුවෙනි. අනුකොටස් 8කින් සමන්විත මෙහි (i) *A* හා *B* කොටස් ද (iv) *A* කොටස ද වැඩි පහසුතාව පෙන්වා ඇත. ප්‍රශ්නයේ (i) කොටසේ *A* හා *B* අනුකොටස්වලට වැඩි පහසුතාව පෙන්නුම් කිරීමට හේතු වී ඇත්තේ උඩරට පාලනය බ්‍රිතාන්‍යයින්ට යටත්වීමේ දී සිදු වූ ඓතිහාසික සංසිද්ධීන් සමඟ ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා හා භාෂා පරිවර්තක ජෝන් ඩොයිලි පිළිබඳ ව 9 ශ්‍රේණියේ දී දැනුවත්ව තිබීමත් 11 ශ්‍රේණියේ දී ඒවා නැවත සාකච්ඡා වීම තුළින් දැනුම තවදුරටත් තහවුරු වීමයි. එසේම (iv) *A* අනු කොටසට වැඩි පහසුතාව දැක්වීමට හේතු වී ඇත්තේ ආගමික පුනර්ජීවය සම්බන්ධයෙන් ප්‍රධාන ආගම් තුනට ම අදාළ ඒ ඒ විශේෂ වූ පුද්ගලයින්ගේ නම් විමසා තිබීම නිසා පිළිතුරු සැපයීම පහසු වීමයි. එසේම (i) *C* කොටසට පහසුතාව 11%කි. එය මෙහි අඩු ම පහසුතාවයි. ආණ්ඩුකාරවරු හා ඔවුන්ගේ කාර්යයන් පිළිබඳ ව දැනුම අඩු වීමත් මාර්ග ඉදිරිකිරීම වැනි අනුකොටස් කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකිරීමත් පහසුතාව අඩු වීමට හේතු වී ඇත. කරුණු වගුගත කිරීම ආණ්ඩුකාරවරු වෙන් වෙන් වශයෙන් ගෙන ඔවුන්ගේ කාර්යයන් අන්තර්ගත වන ලෙස කථික තරග පැවැත්වීම, දැනුම වර්ධනය කර ගැනීමට උපකාර කර ගත හැකි ය.

බ්‍රිතාන්‍ය පාලකයන් ශ්‍රී ලංකාවේ පරිපාලනයට සම්බන්ධ වීම සම්බන්ධ තොරතුරු පෙළගැස්වීමට මීට වඩා අවධානය යොමු කිරීමට අවශ්‍ය වී ඇත. එපමණක් නොව එම වකවානු තුළ බ්‍රිතාන්‍යයන් ලංකාව යටත් විජිතයක් කර ගැනීමට යොදාගත් උපාය මාර්ග විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග තවදුරටත් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී යොදා ගත යුතුව ඇත. (ii) කොටසේ *A*, *B* අනුකොටස්වල හා (iii) කොටසේ පහසුතාව මධ්‍යස්ථව ඇත. ඒවා පිළිවෙළින් 48%, 52% හා 46%වේ. මෙසේ වීමට හේතු වන්නේ 1818, 1848 යන නිදහස් අරගලවලට මූලිකත්වය ගත් නායකයින්ගේ නම් නිශ්චිතව වෙන් කර ගැනීමේ හැකියාව සතුටුදායක මට්ටමක නොමැති වීමයි. මෙම නිදහස් අරගල පිළිබඳ තොරතුරු ගොඩ නැගීමේ දී එකිනෙක අරගලවලට පාදක වූ තොරතුරු විශ්ලේෂණය හා සැසඳීමට හැකි පරිදි වගුගත කරවීම හා චාට් සටහන් පිළියෙළ කිරීම වැනි උපක්‍රම භාවිතා කළ යුතු ව ඇත.

PAST PAPERS WIKI

## III කොටස

### 7 ප්‍රශ්නය


**නිපුණතාව : ඉන්දියාවේ භූගෝලීය පසුබිම් පිළිබඳ දැනුම හා මෞර්ය ගුප්ත යුගවල දේශපාලන තොරතුරුහා ඓතිහාසික විශිෂ්ටත්වය පිළිබඳ දැනුම විශ්ලේෂණාත්මක අවබෝධය පිරික්සීම**

**7.** (i) යාබද සිතියමෙහි $A,B,C,D,E$ හා $F$ යනුවෙන් දක්වා ඇති ස්ථාන අතුරෙන්

1 - වින්ධ්‍යා කඳු  2 - සාංචි  3 - කාලිංග දේශය

යන ස්ථාන දක්වෙන්නේ කවර අක්ෂරවලින් දැයි පිළිවෙළින් ලියා දක්වන්න.

*(ලකුණු 03 යි)*




(ii) පහත දක්වෙන එක් එක් කරුණ හා සම්බන්ධ නිවැරදි පිළිතුර $A,B,C$ හා $D$ අනුපිළිවෙළින් සඳහන් කරන්න.

$A$ - අජාසත් රජතුමා රජගහනුවර වෙනුවට සිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගත් නගරය

$B$ - නන්ද රාජ වංශයේ ආරම්භක පාලකයා

$C$ - හතරවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට අනුග්‍රහය දක් වූ කුෂාණ රජතුමා

$D$ - බටහිර ඉන්දියාවේ ශක ශත්‍රප බලය බිඳ දැමූ ගුප්ත පාලකයා

*(ලකුණු 04 යි)*

(iii) "මෞර්ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම පාලකයා අශෝක රජතුමා ය" කරුණු **තුනක්** ඇසුරෙන් මෙය පැහැදිලි කරන්න.

*(ලකුණු05 යි)*

(iv) ගුප්ත අධිරාජ්‍යයේ පාලන තන්ත්‍රය සංවිධානය වී තිබූ ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න.

*(ලකුණු 06 යි)*

**7. (i)** 1 - $B$  2 - $C$  3 - $A$ **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** $A$ - පාටලීපුත්‍ර (පැට්නා)

$B$ - මහා පත්මනන්ද

$C$ - කණිෂ්ක

$D$ - දෙවන චන්ද්‍රගුප්ත **(ලකුණු 01 × 04 = 04යි)**


**(iii)**
- ★ කාවේරි නදියෙන් දකුණේ සුළු ප්‍රදේශයක් හැර මුළු ඉන්දියාවම යටත් කර ගැනීම
- ★ ශක්තිමත් පාලන ක්‍රමයක් ඇති කිරීම
- ★ බුදුදහමේ ව්‍යාප්තියට කටයුතු කිරීම
- ★ තුන්වෙනි ධර්ම සංගායනාව පැවැත්වීමට අනුග්‍රහය දැක්වීම
- ★ සියලුම ආගම්වලට අනුග්‍රහ දැක්වීම
- ★ පොදු ජනතාවගේ යහපත සඳහා පහසුකම් සපයා දීම (මහාමාර්ග පහසුකම්, ළිං, විශ්‍රාම ශාලා ආදිය...)
- ★ ගෘහ නිර්මාණ හා කලා ශිල්ප දියුණුවට කටයුතු කිරීම
- ★ අසූහාරදාහක් වෙහෙර විහාර කරවීම
- ★ ධර්ම මහාමාත්‍රවරු පත් කිරීම **(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)**
- ★ පාලනයේ මූලිකයා රජු වීම (මහා රාජාධිරාජ)
- ★ මන්ත්‍රිවරු, පරිපාලන සංවිධානයේ ඉහළ බලධාරීන් වීම
- ★ කුමාරමාත්‍යවරුන් හා ආයුක්තවරු මාධ්‍ය පාලනය හා ප්‍රාදේශීය පාලනය සම්බන්ධ නිලධාරීන් වීම
- ★ ප්‍රාදේශීය පාලන ඒකක "භුක්ති" නමින් හැඳින්වීම
- ★ අධිකරණ කටයුතුවලට රජු පෞද්ගලිකවම සහභාගි වීම
- ★ හමුදා නායකයකු සිටි අතර, "මහා දණ්ඩනායක" නිලධාරීන් හමුදාංක භාරව කටයුතු කිරීම

**(ලකුණු 03 + 03 = 06යි)**

PAST PAPERS WIKI


7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




7 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 52%කි. II ප්‍රශ්න පත්‍රයෙහි III කොටසට අයත් මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 35% ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 32% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 19% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 14% ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 14% ක් වන අතර, 35%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04 ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 9 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iii) වන අතර එහි පහසුතාව 62%කි. එසේම පහසුතාව අඩුම කොටස් වන්නේ (ii) *D* අනුකොටස හා (iv) වන කොටසට ය. ඒවායේ පහසුතාව 29% බැගින් වේ.

ඉන්දියාවේ භූගෝලීය පසුබිම පිළිබඳ දැනුම හා මෞර්ය ගුප්ත යුගවල දේශපාලන තොරතුරු හා ඓතිහාසික විශිෂ්ටත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධය පිරික්සීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිතයි. මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 52%ක ප්‍රමාණයකි. ලකුණු 9 හා ඊට අඩුවෙන් 67% ක්ම ලකුණු ලබා ඇත. මෙම ප්‍රශ්නයේ වැඩි පහසුතා දක්වා ඇත්තේ (i) 2, (ii) *A* අනුකොටස්වලට හා (iii) කොටසටයි. ඒවායේ පහසුතා පිළිවෙළින් 61%, 59% හා 62% වශයෙනි. (ii) *D* අනුකොටසට හා (iv) කොටසට අඩුම පහසුතාව පෙන්නුම් කරයි. එය 29% බැගින් වේ.

මෙම ප්‍රශ්නයේ දී (i) කොටසෙහි ඉන්දියාවේ ඓතිහාසික ස්ථාන පිළිබඳ දැනුම විමසා ඇත. එහි (i) 2 හි ඇති එම ප්‍රශ්නයේ දී සාංචි ස්ථූපය පිහිටීම සම්බන්ධ පිළිතුරට ලබා ඇති ලකුණු ඉහළ මට්ටමක් ප්‍රදර්ශනය කරයි. අශෝක රජු පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීමට වැඩි අවධානයක් යොමු කිරීම නිසා ද එතුමා ඉදිකරවන ලද චෛත්‍යයක් වීම නිසා ද එය හඳුනා ගැනීමට හැකි වීම ඉහළ පහසුතාව ලැබීමට හේතු වී ඇත. ප්‍රශ්නයේ II කොටසට ලකුණු වැඩි ප්‍රමාණයක් ලබාගෙන තිබීමෙන් ඉන්දියාවේ රජවරු පිළිබඳ සුවිශේෂී දැනුම ඉහළ මට්ටමක පවතින බව පැහැදිලි ය. මෙහි දී පෙළපොතේ ඇතුළත් තොරතුරු පරිශීලනය කිරීම හා වෙනත් විෂයයන්ගෙන් ලැබෙන තොරතුරු ද සිසු දැනුම මෙවැනි මට්ටමක පැවතීමට ඉවහල් වී ඇත.

මෙම ප්‍රශ්නයේ (iv) කොටස සඳහා අඩුම පහසුතාව දක්නට ලැබීමෙන් පැහැදිලි වන්නේ ගුප්ත අධිරාජ්‍යයේ පාලන තන්ත්‍රය සංවිධානය වීම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති බවයි. ඉන්දියාවේ සිතියමක ප්‍රධාන භූගෝලීය ලක්ෂණ, (කඳුවැටි, ගංගා) වැදගත් ඓතිහාසික ස්ථාන හා ප්‍රදේශ ලකුණු කරවීමට සිසුන් යොමු කිරීම වැදගත් වේ. ඉන්දියාවේ ඒ ඒ යුගවලට අයත් රජවරුන් පිළිබඳ වගුගත සටහන් සකස් කිරීමට සිසුන් යොමු කරවීම. ඇතැම් යුගවලට අදාළ රජවරු හා පාලන තන්ත්‍ර පිළිබඳ තොරතුරු සෙවීම සඳහා අමතර පොත්පත් පරිහරණයට සිසුන් යොමු කරවීම කළ යුතු ව ඇත.

PAST PAPERS WIKI

**8 ප්‍රශ්නය**

**නිපුණතාව : ඉන්දියාව, චීනය හා ජපානය යන රටවල් දේශපාලන හා ආර්ථික වශයෙන් නැගී සිටීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම.**

8. (i) පහත *A*, *B* හා *C* යටතේ දක්වා ඇති එක් එක් කරුණට සම්බන්ධ පුද්ගලයාගේ නම අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A* - නිදහස් ඉන්දියාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා

*B* - යුධ හමුදාවේ පහළම මට්ටමේ සිට එහි පාලකයා දක්වා උසස් වූ ජපාන ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතමයා ලෙස සැලකෙන පුද්ගලයා

*C* - චීනයේ කියැංශී ප්‍රදේශයෙන් ආරම්භ වී යෙනාන් ප්‍රදේශයෙන් අවසන් වූ "දීර්ඝ පා ගමන" සංවිධානය කළ තැනැත්තා

(ලකුණු 03 යි)

(ii) පහත *A*, *B*, *C* හා *D* යටතේ දැක්වෙන එක් එක් කරුණට අදාළ පිළිතුරු වරහන් තුළ දී ඇති ඒවා අතුරින් තෝරා අනුපිළිවෙලට ලියා දක්වන්න.

*A* - ඉන්දියාවේ බ්‍රිතාන්‍ය වෙළෙඳ සමාගමේ පාලනයට යටත් වූ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටය යටතට ගැනීමට මුල් වූ හේතුව

*B* - ජපානයේ කාර්මිකාර්මික දියුණුවට පදනම වැටුණු අවධිය

*C* - ආචාර්ය සුන්-යත්-සෙන් ගේ නායකත්වය යටතේ ගොඩ නැගුණු දේශපාලන පක්ෂය

*D* - ඉන්දියාවේ මුස්ලිම්වරුන් බහුතරයක් වාසය කරන ප්‍රදේශ සඳහා වෙනම නිජබිමක් ඉල්ලා සිටි තැනැත්තා

(ක්වෝමිංටාන්, මොහොමඩ් ඉක්බාල්, මෙයිජි, මොහොමඩ් අලි ජින්නා, ටොකුගාවා, කොමියුනිස්ට්, සිපොයි කැරැල්ල, බෙංගාලය දෙකඩ කිරීම) (ලකුණු 04 යි)

(iii) ඉන්දියානු දේශපාලනයේ තීරණාත්මක සිදුවීමක් ලෙස සැලකෙන 1857 - 1858 සිපොයි කැරැල්ලට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මෙයිජි පාලන සමයේ දී ජපානයේ

*A* - දේශපාලන ප්‍රතිපත්තියෙහි හා

*B* - ආර්ථික ප්‍රතිපත්තියෙහි

සිදු වූ වෙනස්කම් **එක** බැගින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**8. (i)** *A* - ශ්‍රී ජවහල්ලාල් නේරු *B* - හිදෙයෝෂි *C* - මාඕ සේතුං **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - සිපොයි කැරැල්ල *B* - ටොකුගාවා *C* - ක්වොමිංටාන් *D* - මොහොමඩ් අලි ජින්නා

**(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)**
- ★ ඉංග්‍රීසීන් ඉන්දියාවේ ප්‍රදේශ ඈඳා ගැනීමේ දී අනුගමනය කළ අත්තනෝමතික ප්‍රතිපත්තිය
- ★ ඉන්දියානු නායකයන් නිගරුවට පත් කිරීම
- ★ බ්‍රිතාන්‍යයන් ඇති කළ යටිතල පහසුකම් නිසා ඉන්දියාවේ හුදෙකලා බව නැති වීම හා බටහිර ආභාෂයට විවෘත වීම
- ★ බ්‍රිතාන්‍ය පාලකයන් ක්‍රිස්තියානි මිෂනාරීන්ට උදව් දීම
- ★ ඉන්දියාවේ අවශ්‍යතා නොසලකා හැරීම
- ★ ග්‍රීස් තැවරූ පතොරම් පිළිබඳ කටකතා **(ලකුණු 02 + 03 = 05යි)**


**(iv) *A* - දේශපාලන ප්‍රතිපත්ති**
- ★ ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව පිහිටුවීම (ඩයට්)
- ★ පාර්ලිමේන්තුවට මුදල් කටයුතු පිළිබඳ සීමිත බලයක් ලැබීම
- ★ මූලික අයිතිවාසිකම් ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
- ★ සීමිත ඡන්ද බලය
- ★ දේශපාලන පක්ෂ බිහිවීම
- ★ අධිරාජයාගේ බලතල ප්‍රධාන බව පිළිගෙන ව්‍යවස්ථා ගත කිරීම

***B* - ආර්ථික ප්‍රතිපත්ති**
- ★ වැඩවසම් ක්‍රමය අහෝසි කිරීම
- ★ වාණිජ කටයුතු ආර්ථිකයේ ප්‍රමුඛස්ථානයක් ගැනීම හා ධනවාදී ආර්ථිකයට නැඹුරු වීම
- ★ කාර්මිකකරණය කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම
- ★ යටිතල පහසුකම් සඳහා පෞද්ගලික හා රාජ්‍ය මැදිහත් වීම

**(ලකුණු 02 + 04 = 06යි)**

PAST PAPERS WIKI


8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




8 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 37%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 61% ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 22% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 9% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 8% ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 8%ක් වන අතර, 61%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 10 අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (ii) *D* වන අතර එහි පහසුතාව 68%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (i) B වන අතර එහි පහසුතාව 18% කි.

ඉන්දියාව, චීනය හා ජපානය යන රටවල දේශපාලන හා ආර්ථික වශයෙන් නැගී සිටීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම සඳහා මෙම ප්‍රශ්නය සැකසී ඇත.

ප්‍රශ්නය තෝරාගෙන ඇති සංඛ්‍යාව 37%ක් වැනි අඩු සංඛ්‍යාවකි. තෝරා ගත් සංඛ්‍යාවෙන් 61%ක් ම ලකුණු 4 හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත. වැඩිම පහසුතාව දක්වා ඇත්තේ (ii) *D* කොටසට වන අතර, එහි පහසුතාව 68%කි. (i) *B* කොටස සඳහා අඩු ම පහසුතාව පෙන්වයි. එහි පහසුතාව 18%කි. එමෙන් ම (iv) *A* කොටසට ද 19%ක පහසුතාව පෙන්නුම් කරයි.

මෙම ප්‍රශ්නය තෝරා ගැනීම 37% දක්වා අඩු වීමට හේතු වී ඇත්තේ විෂය තොරතුරු ආගන්තුක වීමයි. එමෙන් ම මෙම ප්‍රශ්නයට චීනය, ජපානය හා ඉන්දියාව යන රටවල් තුනක ම ඓතිහාසික තොරතුරු විමසා තිබීම නිසාත් විෂය කොටස් විශාල ප්‍රමාණයක් අඩංගු වීම නිසාත් පිළිතුරු සැපයීම දුෂ්කර වීම තෝරා ගැනීම අඩු වීමට හේතුවකි.

මෙහි (ii) *D* කොටසට වැඩිම පහසුතාවයක් පෙන්වන්නේ ඉන්දියාවේ බහුතර මුස්ලිම් ජන සංඛ්‍යාවක් වාසය කරන ප්‍රදේශ වෙනුවෙන් නිජබිමක් බිහි කිරීමේ ප්‍රමුඛයා වන අලි ජින්නා යන නාමය ජනප්‍රිය වීමත්, එය හොඳින් තහවුරු වී තිබීමත් ය. ජපානය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට ඇති මූලාශ්‍ර අඩු වීමත් අපේක්ෂකයන් එම කරුණුවලට රුචිකත්වයක් නොදැක්වීමත් නිසා ම භාවිතයෙන් ඈත්වීම ජපානය සම්බන්ධ (i) *B* හා (iv) *A* කොටස්වලට පහසුතාව අඩු වීමට බලපා ඇත. මෙම මාතෘකාව පිළිබඳව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ජපන්-චීන ඉතිහාසය පිළිබඳව ගවේශනයට යොමු කරවීම, අන්තර්ජාලයෙන් තොරතුරු ලබා ගැනීමට පහසුකම් සලසා දීම, එම රටවල පිහිටීම සිතියම් මගින් පෙන්වා දීම හා සිදුවීම් සඳහන් කොට ඒ සම්බන්ධ පුද්ගලයින්ගේ නම් නිවැරදිව ලිවීමේ ක්‍රියාකාරකම්වලට යොමු කරවීම තුළින් විෂය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.

PAST PAPERS WIKI

**9 ප්‍රශ්නය**

**නිපුණතාව : යුරෝපයේ විද්‍යා පුනරුදයට දායකවූවන් හා කාර්මික විප්ලවයට සම්බන්ධ තොරතුරු විශ්ලේෂණාත්මකව විමසීමේ හැකියාව පිරික්සීම**

**9.** (i) පහත *A, B* හා *C* යටතේ දක්වා ඇති නව සොයා ගැනීම්වලට සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි පිළිවෙළින් දක්වන්න.

*A* - ගුරුත්වාකර්ෂණ නියමය

*B* - මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු

*C* - මුද්‍රණ යන්ත්‍රය (ලකුණු 03 යි)

(ii) පහත දක්වෙන ඓතිහාසික තොරතුරුවලට අදළ පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.

*A* - ක්‍රි.ව. 1453 දී තුර්කීන් විසින් අල්ලා ගත් නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර

*B* - ක්‍රි.ව. 1498 දී ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩබට පෘතුගීසි නාවිකයා

*C* - දේශගවේෂණ කටයුතුවල යෙදෙන අයට විවිධ අයුරින් සහාය දක් වූ පෘතුගාලයේ රාජකීයයා

*D* - රෙපරමාදු ආගමික අදහස් ප්‍රචාරයට මුල් වී කටයුතු කළ පුද්ගලයා

(මාටින් ලූතර්, වස්කෝද ගාමා, ක්‍රිස්ටෝපර් කොලොම්බස්, ඉසබෙලා බිසව, වැනීසිය, ජෝන් කැල්වින්, නාවුක හෙන්රි, කොන්ස්තන්තිනෝපලය,) (ලකුණු 04 යි)

(iii) "කාර්මික විප්ලවය ආරම්භ වූ මුල් ම රට එංගලන්තයයි." මෙයට පසුබිම් වූ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවය නිසා

*A* - දේශපාලන

*B* - ආර්ථික

*C* - සමාජයීය

යන ක්ෂේත්‍රයන්හි ඇති වූ වෙනස්කම් **එක** බැගින් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**9.** **(i)** *A* - සර් අයිසැක් නිව්ටන්

*B* - විලියම් හාවේ

*C* - ජොහැන්නස් ගුටන්බර්ග් **(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - කොන්ස්තන්තිනෝපලය

*B* - වස්කෝද ගාමා

*C* - නාවුක හෙන්රි

*D* - මාටින් ලූතර් **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)**
- ★ වාණිජ කටයුතු පුළුල් වීම නිසා බ්‍රිතාන්‍යයේ ධනවත් පිරිසක් බිහිවීම
- ★ රට තුළ කාර්මික අමුද්‍රව්‍ය සුලභ වීම (ගල් අඟුරු, යපස්)
- ★ දේශීය හා විදේශීය වෙළෙඳාම පුළුල් වීම (යටත් විජිතව තිබීම නිසා)
- ★ ජනගහනය වැඩි වීමත් සමග භාණ්ඩ ඉල්ලුම වැඩි වීම
- ★ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා නගරයට ඇදී ආ අතිරික්ත ශ්‍රමය කර්මාන්ත සඳහා යොදා ගැනීම
- ★ විද්‍යාත්මක සොයාගැනීම් සඳහා බ්‍රිතාන්‍ය රාජකීය සංගමය අනුග්‍රහය දැක්වීම
- ★ අභ්‍යන්තර තීරුබදු ප්‍රතිපත්තිය වෙනස් කිරීම
- ★ ප්‍රවාහනයේ දියුණුව

**(ලකුණු 02 + 03 = 05යි)**

**(iv)** *A* - **දේශපාලන**
- ★ දේශපාලන මතවාදයන් බිහිවීම (සමාජවාදය, ලිබරල් වාදය)
- ★ වෘත්තීය සංගම් බිහිවීම
- ★ නව අධිරාජ්‍යවාදය ඇති වීම

PAST PAPERS WIKI

***B*** **- ආර්ථික**

- ★ නිෂ්පාදන ධාරිතාවය පුළුල් වීම
- ★ කෘෂි නිෂ්පාදන කටයුතු කාර්මිකරණය වීම
- ★ බහු ජාතික වෙළෙඳ සමාගම් බිහිවීම
- ★ ආනයන-අපනයන වෙළෙඳ ආර්ථිකය ප්‍රමුඛ වීම
- ★ බැංකු හා රක්ෂණ කටයුතු පුළුල් වීම


***C*** **- සමාජයීය**

- ★ ජනාකීර්ණ නගර බිහිවීම
- ★ පන්ති සමාජයක් බිහිවීම (ධනවත්, නිර්ධන)
- ★ මුඩුක්කු පැල්පත් බිහිවීම සහ සමාජ අපචාර
- ★ පරිසර දූෂණය

**(ලකුණු 03 + 03 = 06යි)**

**9 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

9 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය





9 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 74%කි. II ප්‍රශ්න පත්‍රයෙහි III කොටසෙන් වැඩි ම ප්‍රතිශතයක් තෝරා ගත් ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 35% ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 29% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 19% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 17% ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 17%ක් වන අතර, 35%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.

9 ප්‍රශ්නයේ කොටස්වල හා අනුකොටස්වල පහසුතාව




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 11 අතුරෙන් පහසුතාව වැඩි ම අනුකොටස (i) *A* වන අතර එහි පහසුතාව 87%කි. එසේම පහසුතාව අඩු ම අනුකොටස වන්නේ (iv) *A* වන අතර එහි පහසුතාව 35%කි.

PAST PAPERS WIKI

යුරෝපයේ විද්‍යා පුනරුදයට දායක වූවන් හා කාර්මික විප්ලවය සම්බන්ධ තොරතුරු විශ්ලේෂණාත්මකව විමසීමේ හැකියාව පිරික්සීම අපේක්ෂිත වේ. මෙම ප්‍රශ්නය අනුකොටස් 11කින් සමන්විත වේ. 74%ක් මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත. මෙහි පහසුතාව වැඩිම (i) *A* කොටසයි. එය 87%කි. එහි දී අසා ඇති ගුරුත්වාකර්ෂණ නියමය පිළිබඳ ව පහළ ශ්‍රේණිවල දී සිට ම ඉතිහාසය හා වෙනත් විෂයයන්ට අදාළව ද, සාමාන්‍ය දැනුම මිනුම තරග ආදියේදී ද, භාවිතයට ගැනෙන කරුණක් වීම එම ඉහළ පහසුතාවට හේතු ලෙස දැක්විය හැකි ය.

අඩු ම පහසුතාව (iv) *A* අනුකොටසට 35%කි. පහසුතාව අඩු වීමට හේතු ලෙස පැහැදිලි වූයේ කාර්මික විප්ලවය නිසා ඇති වූ ප්‍රතිඵල වෙන් වශයෙන් ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ ව විශ්ලේෂණය කර ගැනීමේ හැකියාව අඩුවීම නිසා බව කිය යුතු ය. මෙම තත්ත්වය මගහරවා ගැනීමට කාර්මික විප්ලවයේ ප්‍රතිඵල දේශපාලන, ආර්ථික හා සමාජයීය යන ක්ෂේත්‍රවලට අදාළ ව වෙන්කර වගුගත කර දැක්වීම වැනි ක්‍රම ශිල්පවලට සිසුන් යොමු කිරීම වඩාත් යෝග්‍ය වේ. මෙම ප්‍රශ්නයේ (ii) *A*, *B*, *D* යන අනුකොටස්වලට 76%, 64% හා 64% පිළිවෙළින් ඉහළ පහසුතා පෙන්වා ඇත. මෙම තත්ත්වය පැවතීමට 8 ශ්‍රේණියේ දී මෙම විෂය කරුණු හැදෑරීමට අවස්ථාව ලැබීම හා 10 ශ්‍රේණියේ දී විස්තරාත්මකව එම කරුණු නැවත අධ්‍යයනයට මගපෙන්වීම ද හේතු ලෙස සඳහන් කළ හැකි ය. (ii) *C* කොටසේ පහසුතාව 48% ක් වුව ද සෙසු ප්‍රශ්න හා සසඳා බැලීමේ දී එය ඉහළ තත්ත්වයකි.

ප්‍රශ්නයේ අඩු පහසුතාව ඇති සෙසු කොටස්වල එම ගැටළුව මගහරවා ගැනීමට පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වෙනත් යෝග්‍ය ක්‍රම ශිල්ප භාවිතා කිරීම ද යොදා ගත හැකි ය.

නිදසුන් : අනාවරණ ඉගෙනුම් ක්‍රමය, බුද්ධි කලම්භන සාකච්ඡා, ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්, ව්‍යූහගත රචනා වැනි උපක්‍රම අනුගමනය කිරීම යෝග්‍ය වේ.

PAST PAPERS WIKI

10 ප්‍රශ්නය

**නිපුණතාව : ලෝක මහා සංග්‍රාමයන්ට සම්බන්ධවූ රටවල්, නායකයන් හා ඔවුන්ගේ ක්‍රියාකලාපයන් ද දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලොව ඇති වූ දේශපාලනික වෙනස්කම් ද විමසීමේ හැකියාව පිරික්සීම**

**10.** (i) *A* - පළමුවන ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ මිත්‍ර පිලේ රටක් නම් කරන්න.

*B* - පළමුවන ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ මධ්‍යම බලවතුන්ගේ පිලේ රටක් නම් කරන්න.

*C* - පළමුවන ලෝක මහා සංග්‍රාමයට ආසන්න ම හේතුව සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත දක්වෙන්නේ දෙවන ලෝක මහා සංග්‍රාමය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි. ඒ හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙලින් සඳහන් කරන්න.

*A* - මිත්‍ර පක්ෂයේ නායකත්වය ගත් බ්‍රිතාන්‍යයේ අග්‍රාමාත්‍යවරයා

*B* - කොන්දේසි විරහිතව මිත්‍ර පක්ෂයට යටත් වීමට තීරණය කළ ජපන් අධිරාජයා

*C* - යුද්ධය සඳහා ඉතාලිය මෙහෙය වූ නායකයා

*D* - යුද්ධයෙන් පරාජය වූ ජපානයට දඬුවම් නොකිරීමට සැන් ප්‍රැන්සිස්කෝ සම්මේලනයේ දී සෙසු රටවල් එකඟකරවා ගත් ශ්‍රී ලංකා නියෝජිතයා (ලකුණු 04 යි)

(iii) *A* - ※ පළමුවන ලෝක සංග්‍රාමයෙන් පරාජයට පත් වූ ජර්මනියට දඬුවම් පමුණුවන ලද්දේ කවර ගිවිසුමක් මගින් ද?

※ හිට්ලර් විසින් රචනා කරනු ලැබූ නාසිවාදයේ අත් පොත ලෙසින් සලකනු ලැබූ ග්‍රන්ථයෙහි නම කුමක් ද?

*B* - හිට්ලර් යටතේ ජර්මනියේ ක්‍රියා කලාපය දෙවන ලෝක මහා සංග්‍රාමයට හේතු වූ ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ලෝක දේශපාලනයේ වෙනස්කම් ගණනාවක් ඇති විය. මේ බව නිදසුන් **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**10.** **(i)** *A* - මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය

*B* - ජර්මනිය, ඕසට්‍රියාව, ඉතාලිය, තුර්කිය, බල්ගේරියාව, හංගේරියාව

*C* - සරයේවෝ සිද්ධිය (ඕස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු සර්බියාවේ දී ඝාතනය කිරීම)

**(ලකුණු 01 × 03 = 03යි)**

**(ii)** *A* - සර් වින්ස්ටන් චර්චිල්

*B* - හිරෝහිතෝ අධිරාජයා

*C* - බෙනිටෝ මුසොලිනි / මුසොලිනි

*D* - ජේ.ආර්. ජයවර්ධන **(ලකුණු 01 × 04 = 04යි)**

**(iii)** *A* - වර්සේල්ස් ගිවිසුම

- මගේ සටන / මයින් කාම්ෆ්

*B* - බලසම්පන්න අධිරාජ්‍යයක් ලෙස ජර්මනිය ගොඩනැගීමට උත්සහ දැරීම


- නාසි ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර විරුද්ධවාදීන් විනාශ කිරීම
- **ජර්මනියේ ආක්‍රමණකාරි ප්‍රතිපත්තිය**
  - ★ 1936 දී රයින්ලන්තය අල්ලා ගැනීම
  - ★ ඕස්ට්‍රියාව ජර්මනියට ඒකාබද්ධ කිරීම
  - ★ 1939 චෙකොස්ලොවැකියාව ආක්‍රමණය කර අල්ලා ගැනීම
  - ★ 1939 පෝලන්තයට පහර දීම
  - ★ 1940 දී ප්‍රංශයට පහර දී පැරිස් නගරයට ඇතුලු වීම
  - ★ 1940 බ්‍රිතාන්‍යයට ගුවන් ප්‍රහාර එල්ල කිරීම
  - ★ රුසියාව ආක්‍රමණය කිරීම **(ලකුණු 02 + 03 = 05යි)**

PAST PAPERS WIKI

**(iv)**
- ★ ජර්මනිය හා කොරියාව දෙකඩ වීම
- ★ ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව සුපිරි බලවතුන් ලෙස නැගී සිටීම
- ★ ලෝකය බල කඳවුරු දෙකකට බෙදීම
- ★ ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු යටත් විජිත රටවලට නිදහස ලැබීම
- ★ එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම
- ★ නව රාජ්‍ය බිහි වීම (ඊශ්‍රායලය)
- ★ ඒකරාශී වී සංවිධාන බිහිකර ගැනීම

**(ලකුණු 03 + 03 = 06යි)**


**10 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




10 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 34%කි. II ප්‍රශ්න පත්‍රයෙහි (iii) කොටසෙන් අඩුම ප්‍රතිශතයක් තෝරා ගත් ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 18ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 04 ප්‍රාන්තරයේ 36% ක් ද,
ලකුණු 05 - 09 ප්‍රාන්තරයේ 25% ක් ද,
ලකුණු 10 - 13 ප්‍රාන්තරයේ 19% ක් ද,
ලකුණු 14 - 18 ප්‍රාන්තරයේ 20% ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 14ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 20%ක් වන අතර, 36%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 04ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් අතුරෙන් පහසුතාව වැඩි ම අනුකොටස (i) *A* වන අතර එහි පහසුතාව 89%කි. එසේම පහසුතාව අඩු ම කොටස වන්නේ (iv) වන අතර එහි පහසුතාව 43%කි.

PAST PAPERS WIKI

ලෝක මහා සංග්‍රාමයන්ට සම්බන්ධ වූ රටවල්, නායකයන් හා ඔවුන්ගේ ක්‍රියාකලාපයන් ද දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලොව ඇති වූ දේශපාලනික වෙනස්කම් ද විමසීමේ හැකියාව පිරික්සීම මෙයින් අපේක්ෂිතය.

මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති සංඛ්‍යාව මුලු අයදුම්කරුවන්ගෙන් 34%කි. තෝරාගත් සංඛ්‍යාවෙන් 61%ක් ලකුණු 9ට වඩා අඩුවෙන් ලබාගෙන ඇත. මෙහි අනුකොටස් 9 අතරින් (i) *A*, *B* හා *C* කොටස් වැඩි පහසුතාවක් පෙන්වයි. එය පිළිවෙළින් 89%, 83% හා 72% වශයෙනි.


පළමු ලෝක සංග්‍රාමය ඇසුරින් මෙම කොටස් තුනම අසා තිබීමත් ඒවා ඉතා ම සරල විෂය කොටස් වීමත් පිළිතුරු සැපයීම පහසු වීමට හේතු වේ. මෙහි අවම පහසුතාව දක්වා ඇත්තේ (iv) කොටසට ය. එය 43%කි. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලෝක දේශපාලනයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ ව දැනුම සතුටුදායක මට්ටමක නොමැති වීම, පිළිතුර නිදසුන් සහිතව ඉදිරිපත් කිරීමේ දුර්වලතාව පැවතීම පහසුතාවය අඩු වීමට හේතු වී ඇත.

(iii) කොටස *A* හා *B* අනුකොටස් දෙකකින් යුතු වේ. *A* කොටසට හිමි ලකුණු 2 පියවර දෙකකින් ලබා දීමට කටයුතු කිරීම අපේක්ෂකයන්ගේ පහසුතාව ඉහළ මට්ටමක පැවතීමට හේතු වී ඇත. ඒ අනුව III කොටසේ පහසුතාවයේ සාමාන්‍ය අගය 55% ක් වී ඇත.

මෙබඳු ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ලෙස ලෝක බලවතුන්, ප්‍රධාන පිල්, ඒවාට සම්බන්ධ රාජ්‍ය නායකයින් පිළිබඳ ව සිසුන්ට සිතට කා වදින පරිදි ග්‍රහණය කරවීම ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, තොරතුරු පත්‍රිකා පිළියෙළ කොට සිසුන් අතර හුවමාරු කිරීමට කටයුතු කිරීම යනාදි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම වැදගත් වේ.

PAST PAPERS WIKI

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




**I කොටස**

I කොටසට පළමු ප්‍රශ්නය පමණක් අයත්වන අතර, එය අනිවාර්ය වේ. මෙම ප්‍රශ්නය සකස් වී ඇත්තේ (අ) (i), (ii) හා (ආ) (i), (ii), (iii) යන අනුකොටස්වලිනි.

ලංකා ඉතිහාසයට අදාළ තොරතුරු නියෝජනය වන්නේ (අ) (i), (අ) (i) $A, C, D$ සහ (iii) යන කොටස්වලට ය. ලෝක ඉතිහාසයට අදාළ තොරතුරු නියෝජනය වන්නේ (1) (අ) (ii) (ආ) (i) $B$ හා (ආ) (ii) යන කොටස්වල ය. පළමු ප්‍රශ්නයේ පහසුතාව ලංකා ඉතිහාසයට 44% හා ලෝක ඉතිහාසය 47% වේ.

ලංකා ඉතිහාසය ආශ්‍රිතව ඉදිරිපත් කොට ඇති ප්‍රශ්න අතරින් වැඩි ම පහසුතාව දක්වා ඇත්තේ පොළොන්නරු යුගය හා සම්බන්ධ වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් වූ ශිව දේවාල ආශ්‍රිතව සකස් වූ ප්‍රශ්නයයි. (ආ) (iii) හි 1, 2 හා 3 අනුකොටස්වලින් අසා ඇති ප්‍රශ්නවලට ය.) මීට හේතු වන්නේ මෙම විෂය කරුණු නිරන්තරයෙන් භාවිත වීම නිසාත් පොළොන්නරු රාජධානියට සුවිශේෂී වූ ආගමික ගොඩනැගිල්ලක් වීම නිසාත් වේ. එසේම නිදහස් ලංකාවේ ප්‍රථම අගමැතිවරයා පිළිබඳ අසා ඇති ප්‍රශ්නයට 71% පහසුතාව ලබා ඇත. ඊට හේතු වූයේ මෙම ප්‍රශ්නය සාමාන්‍ය දැනුමට සම්බන්ධ වීම හා ප්‍රශ්නය ඇසුරින් සුවිශේෂ පුද්ගලයෙකු වූ ඩී.එස්. සේනානායක මහතා පිළිබඳව අසා තිබීම වේ. සිතියම් ලකුණු කිරීම දුර්වල මට්ටමක තිබෙන අතර මෙහි පහසුතාව ලංකා හා ලෝක සිතියම් දෙකෙහිම 40%ට වඩා අඩු වී ඇත. එය ලංකා 36% හා ලෝකය කොටසට 33% වශයෙනි. මෙම කොටස්වලට අදාළ ප්‍රශ්නවල සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා සිතියම් අභ්‍යාසකරණය වැඩි වශයෙන් කරවීම ස්ථානවල නිශ්චිත බව පිළිබඳ අවධානය යොමු කිරීම, පෙළපොතට අදාළ පින්තූර පෙන්වා ඒවා පිළිබඳ ක්ෂණික කතා පැවැත්වීම, කෙටි ප්‍රශ්න සැකසීම වැනි දේ සිසුන් ලවා කරවීම සුදුසු ය.

PAST PAPERS WIKI

**II කොටස**

ලංකා ඉතිහාසයට අදාළව II කොටසේ ප්‍රශ්න 5ක් ඇත. පිළිතුරු සැපයිය යුත්තේ ඉන් ප්‍රශ්න තුනකට පමණි. මෙම කොටසට අදාළව පහසුතාව 44%කි. මෙහි ප්‍රශ්න තෝරා ගැනීම 2 වන ප්‍රශ්නයට 81%ක් ද 3 වන ප්‍රශ්නයට 61%ක් ද 4 වන ප්‍රශ්නයට 56%ක් ද 5 වන ප්‍රශ්නයට 57%ක් ද 6 වන ප්‍රශ්නයට 43%ක් ද ආදි වශයෙනි. වැඩි ම තෝරා ගැනීමක් පෙන්වන්නේ 2 වන ප්‍රශ්නයට යි. අනුරාධපුර යුගයේ මුල්කාලයේ සිදු වූ ආර්ය සංක්‍රමණ, ආර්යයන් ජනාවාස පිහිටුවා ගැනීමට උපයෝගි කරගත් ගංගා, ජල සම්පාදන ව්‍යාපාරවල ආරම්භයට බලපෑ පසුබිම සහ පණ්ඩුකාභය රජතුමාගේ පාලනයේ ස්වභාවය වැනි ඉතා සරල හා නිරවුල් කරුණු පිළිබඳ ව තොරතුරු විමසා තිබීම වැඩි සිසුන් ප්‍රමාණයක් තෝරා ගැනීමට බලපා ඇත.

මෙම කොටසින් අඩු ම තෝරා ගැනීමක් සිදු වී ඇත්තේ 6 වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 43%කි. මෙම ප්‍රශ්නයෙන් බටහිර ජාතින්ගේ පාලන සමය පිළිබඳ තොරතුරු රාශියක්, උදාහරණ: 1818 නිදහස් අරගලය, 1848 නිදහස් අරගලය, ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු, ආගමික හා සංස්කෘතික තොරතුරු පුද්ගලයින් ආදිය විමසා තිබීම හේතුකොට ගෙන ප්‍රශ්නයේ සංකීර්ණ බව නිසා එය තෝරා ගැනීම අඩු වී ඇත. ඉගැන්වීම් කටයුතුවල දී මෙම විෂය කොටස් සංසන්දනාත්මකව හා ප්‍රියජනක වන ආකාරයෙන් ඉගැන්වීමෙන් තොරතුරු සරලව ග්‍රහණය කර ගත හැකි ය. එමෙන්ම විවාද, පැවරුම්, නාට්‍යානුසාර භූමිකා රංගන ආදිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගත හැකි වේ.

**III කොටස**

මෙම කොටස ලෝක ඉතිහාසයට අදාළ ප්‍රශ්න 4කින් සමන්විතය. පිළිතුරු සැපයිය යුත්තේ ප්‍රශ්න 2කට පමණි. මෙහි දී ඉන්දියාවේ භෞතික, දේශපාලන, ආගමික තොරතුරු, චීනය, ජපානය හා ඉන්දියාව යන ප්‍රබල ආසියාතික රටවල් තුන වර්තමානයේ නැගී සිටීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග, යුරෝපයේ කාර්මික විප්ලවය සහ ලෝක සංග්‍රාම ඇසුරින් මෙම කොටසේ ප්‍රශ්න සකස් වී ඇත.

මෙම කොටසේ සමස්ත පහසුතාව 46%කි. 7, 8, 9 හා 10 ප්‍රශ්න තෝරා ගැනීම පිළිවෙළින් අයදුම්කරුවන්ගෙන් 52%, 37%, 74% හා 34% ලෙස ය. ඒ අනුව වැඩි ම තෝරා ගැනීම පිළිඹිබු වන්නේ කාර්මික විප්ලවය හා සම්බන්ධ 9 වන ප්‍රශ්නය වේ. එහි අනුකොටස (i) *A* හි පහසුතාව 87%කි. අවම පහසුතාව 35%ක් වන්නේ අනුකොටස (iv) *A* සඳහා ය.

මෙම කොටසේ ප්‍රශ්න අංක 9 වැඩි ම පහසුතා ප්‍රශ්නය යි. එයට හේතු වී ඇත්තේ, විවිධ විෂය ක්ෂේත්‍රවලදී මේ පිළිබඳව වැඩි තහවුරු කිරීමක් සිදුව ඇති බැවිනි. එමෙන් ම මෙහි (iv) *A* හි අවම පහසුතා කෙරෙහි කිසියම් සමාජ සංසිද්ධියක් දෙස සමාජ, ආර්ථික හා දේශපාලන යන ක්ෂේත්‍ර ඔස්සේ විමර්ශනාත්මක ඇසකින් බැලීමේ කුසලතාවය ප්‍රමාණවත් පරිදි වර්ධනය වී නොමැති බව ප්‍රකට වේ. මේ නිසා පංති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සමාජ සංසිද්ධි දෙස දේශපාලන, සමාජ, ආර්ථික ලෙස විමර්ශනාත්මකව කරුණු එළි දැක්වෙන ආකාරයෙන් යෝග්‍ය ක්‍රම ශිල්ප තෝරා ගැනීමත් ඒ අනුසාරයෙන් පාඩම සංවිධානය කර ගැනීමත් අත්‍යවශ්‍ය කරුණක් බවට පත්විය යුතු බව පැහැදිලි වේ.

PAST PAPERS WIKI

## III කොටස

3 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

3.1 **පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

**පොදු උපදෙස් :**

★ ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.

★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.

★ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

★ ප්‍රශ්න අංක, කොටස් අංක හා අනුකොටස් අංක නිවැරදිව ලිවිය යුතුය.

★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.

★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

★ II පත්‍රයේ එකිනෙක කොටස්වලින් නියමිත ප්‍රශ්න සංඛ්‍යාවට පමණක් පිළිතුරු සැපයීමට කාලය මිඩංගු කළ යුතු අතර, වැඩිපුර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට කාලය වැය නොකළ යුතුය.

**විශේෂ උපදෙස් :**

★ සිතියම් ලකුණු කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :
- නගර ලකුණු කිරීමේ දී නිවැරදි ස්ථානය පැහැදිලිව තිත් ලකුණක් යොදා ලකුණු කර නම් කිරීම
- වැව් ලකුණු කිරීමේ දී නිවැරදි වැව තෝරාගෙන මායිම් තුළ ප්‍රදේශය අඳුරු කර නම් කිරීම
- ගංගා සහ කඳුවැටි ලකුණු කිරීමේ දී නිවැරදිව හඳුනාගත හැකිවන ලෙස නම් කිරීම

★ අසා ඇති ප්‍රශ්නවලට උචිත පරිදි පිළිතුරු ඉදිරිපත් කිරීම

★ කරුණු දැක්වීම හා ඒවා පැහැදිලි කිරීම, විස්තර කිරීම හෝ සනාථ කිරීම අනුව ප්‍රශ්නවල ලකුණු බර තබා ඇති බව තේරුම් ගැනීම

★ ව්‍යුහගත රචනා වර්ගයේදී නිදසුන් හා සාධක ඉදිරිපත් කළ යුතු වීම

★ පිළිතුරු ලිවීමේ දී ඇගයීමේ පහසුව සඳහා අවශ්‍ය තැන්හි ඡේද වෙන් කළ යුතු වීම

★ අනුපිළිවෙළින් පිළිතුරු නම් කිරීම කළ යුතු අවස්ථාවලදී ඒ සඳහා සැළකිලිමත් වීම

PAST PAPERS WIKI

**විදුහල්පතිවරුන් උදෙසා උපදෙස් :**

- ★ විෂය සංවර්ධනය සඳහා වාර්ෂික සැලසුම් සකස් කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මගපෙන්වීම හා අනුග්‍රහය තවදුරටත් පුළුල් අයුරින් ලබා දිය යුතු ය.

- ★ විෂය සංවර්ධනය සඳහා අභ්‍යන්තර ඇගයීම් හා අධීක්ෂණ ක්‍රියාවලිය යාවත්කාලීනව සැලසුම් කර සංවිධානාත්මකව පවත්වාගෙන යා යුතු ය.

- ★ ගුරුවරුන්ගේ විෂය සංවර්ධනය සඳහා කොට්ඨාශ, කලාප හා අමාත්‍යාංශ මට්ටමින් පවත්වන වැඩමුළු සඳහා සෑම ගුරුභවතකු ම සහභාගී කරවීමට කාරුණික විය යුතු ය.

- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

- ★ කාලසටහන් ලබා දීමේ දී විෂය ප්‍රවීණතාවය සහිත ගුරුභවතුන්ට මූලිකත්වය ලබා දීම අත්‍යාවශ්‍ය ය.

- ★ ගුරුභවතුන්ට තම විෂය පිළිබඳ වගකීම පැවරෙන පරිදි විෂය මාලාව ක්‍රියාත්මක කිරීම අවස්ථාව ලබා දීම. (එක් ශිෂ්‍ය කණ්ඩායමක් වසර කීපයක් එක් ගුරුභවතකුගේ විෂය භාරකාරත්වයට සම්බන්ධ කිරීම)

- ★ වාර්ෂිකව ත්‍යාග, සහතිකපත් ලබා දීම වැනි ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය තවදුරටත් යොමු කරවීම

- ★ ඉතිහාසය විෂය සංවර්ධනය සඳහා පාසලේ පවතින සම්පත්වලට ගැළපෙන පරිදි ස්ථානයක්, උපකරණ, ආශ්‍රිත ග්‍රන්ථ, සිතියම් ලබා දීම ආදි අවශ්‍ය පියවර ගැනීමට තවදුරටත් කාරුණික විය යුතු ය.

- ★ විවිධ විෂයයන් සඳහා පුහුණුව හෝ පත්වීම් ලැබූ ගුරුභවතුන්ගේ කාල සටහන සම්පූර්ණ කිරීමේ අපේක්ෂාවෙන් ඉතිහාසය විෂය ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් සඳහා යොමු නොකළ යුතු ය. එය විෂයට හානියකි.

**විෂයභාර ගුරුභවතුන්ට උපදෙස් :**

- ★ අ.පො.ස.(සා.පෙළ)ට නියමිත විෂය නිර්දේශය ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු ය.

- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කරමින් එය ද ඉගෙනුම් උපකරණයක් වශයෙන් භාවිත කිරීමට වඩාත් අවධානය යොමු කරවීම.

- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ ඒ නිපුණතාවයන්ට හා විෂය සන්ධාරයට අදාළ යෝග්‍යතම ඉගෙනුම් ක්‍රමවේද තෝරා ගත යුතු ය.

- ★ හැකිතාක් දුරට ඉගෙනුම් ආධාරක තුළින් සංකල්ප සාධනයට අවස්ථා සලසා දිය යුතු ය.

- ★ අ.පො.ස.(සා.පෙළ) විභාගය සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් සකස් කොට ඇති ඇගයීම් වාර්තා පරිශීලනය කොට එය විෂය සංවර්ධනය සඳහා යොදා ගත යුතු ය.

- ★ අඩු සාධන මට්ටම් පෙන්නුම් කෙරෙන විෂය කොටස් සඳහා විශේෂ වැඩමුළු, කඳවුරු, ව්‍යාපෘති, පැවරුම් වැනි ක්‍රියාකාරකම් යොදා ගත හැකිය.

PAST PAPERS WIKI

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

★ ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීම් ක්‍රියාවලිය තුළින් ප්‍රතිඵල සංවර්ධනය සඳහා

- ඉගෙනුම් ආධාරක භාවිත කිරීම
- විෂය ක්‍රියාකාරකම් ප්‍රබෝධ ජනක අයුරින් සංවිධානය කිරීම
- සැලසුම් කරන ලද ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම
- විශේෂයෙන්ම පෙළපොත පරිහරණය සඳහා යොමු කිරීම
- සිසු නිර්මාණ (විෂයයට අදාළ) පන්තියේ ප්‍රදර්ශනය කිරීම ( බිත්ති පුවත්පත්, සඟරා, ප්‍රහේලිකා, කෙටි ප්‍රශ්න හා පිළිතුරු සංග්‍රහ සකස් කිරීම)
- ඉතිහාසය විෂයය සඳහා කාමරයක්/ ප්‍රදේශයක් වෙන් කර සංවර්ධනය කිරීම
- විවෘත ග්‍රන්ථ පරීක්ෂණවලට යොමුකොට කරණු ගවේෂණය කිරීම
- ආධාරක වශයෙන් නිවැරදි සිතියම් භාවිත කිරීම හා සිතියම් සංග්‍රහ සකස් කරවීම
- පිළිතුරු ලිවීමේ දී කරුණු සංවිධානය, ප්‍රගුණ කිරීමේ අභ්‍යාස කරවීම
- ගමෙහි/ ප්‍රදේශයෙහි/ රටෙහි ඓතිහාසික ස්ථාන හා සිදුවීම් ජනප්‍රවාද ඇසුරෙන් සොයා බැලීමට යොමු කිරීම
- රූපවාහිනී/ ගුවන්විදුලි/ පුවත්පත්වල අධ්‍යාපනික වැඩසටහන් සාකච්ඡා සහ ලිපිවලින් තොරතුරු රැස් කිරීමට යොමු කිරීම.
  (නිද - මහා සංචාරේ, වන්දනා)
- ප්‍රවීන දේශකයන්ගේ උදව් උපකාර ලබා ගැනීම
- බුද්ධි මණ්ඩල සාකච්ඡා, විවිධ පාසල් තුළ හා පාසල් අතර සංවිධානය

PAST PAPERS WIKI